කාර්යසාධන වාර්තාව

செயற்திறன் அறிக்கை

Performance Report

2022



අග්‍රාමාත්‍ය කාර්යාලය

பிரதம அமைச்சர் அலுவலகம்

Prime Minister's Office



කාර්යසාධන වාර්තාව

2022

අග්‍රාමාත්‍ය කාර්යාලය

දුරකථන : **011-2575317**
ෆැක්ස් : **011-2575310**
විද්‍යුත් ලිපිනය : info@pmoffice.gov.lk
වෙබ් අඩවිය : www.pmoffice.gov.lk
ලිපිනය : **58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත**
කොළඹ 07

පටුන

පිටු අංකය

1. ආයතනික පැතිකඩ 1

1.1. හැඳින්වීම 1

1.2. ආයතනික දැක්ම හා මෙහෙවර 2

1.3. ප්‍රමුඛතා 2

1.4. අග්‍රාමාත්‍ය කාර්යාලයේ සංවිධාන ව්‍යුහය 4

2. ප්‍රගතිය හා අනාගත දැක්ම 5

2.1 ප්‍රතිපත්ති සම්පාදනය 5

2.2. සංවර්ධන කටයුතු සඳහා මැදිහත්වීම 7

2.3. විවිධ සංවිධාන හා මහජනතාව විසින් කරනු ලබන ඉල්ලීම් සඳහා මැදිහත්වීම 13

2.4. කාලීන ජාතික අවශ්‍යතාවයන් සඳහා දායකත්වය 16

2.5. සැලසුම්කරණය හා වාර්තාකරණය 21

2.6. පාර්ලිමේන්තු හා අමාත්‍ය මණ්ඩල කටයුතු 22

2.7. නෛතික කටයුතු 26

2.8. ආයතනික හා කාර්ය මණ්ඩල කටයුතු 27

2.9. ඩිජිටල්කරණය හා නව්‍යකරණය 29

2.10. විගණනය, කළමනාකරණය හා වාර්තාකරණය 31

2.11. රාජ්‍යතාන්ත්‍රික හා ජාත්‍යන්තර කටයුතු 34

2.12. මහජන පැමිණිලි හා දුක් ගැනවිලි සඳහා සහන සැලසීම 38

2.13. මාධ්‍ය හා සන්නිවේදනය 40

2.14. ආගමික කටයුතු සඳහා මැදිහත්වීම 43

පිටු අංක

3. වසරේ මූල්‍ය කාර්යසාධනය 47

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 47

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 48

3.3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය 49

4. ආයතනයේ කාර්යසාධන දර්ශක 50

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්මට අනුව) 50

5. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ කාර්යසාධනය 57

5.1. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ කාර්යසාධන දර්ශක 57

5.2. තිරසර සංවර්ධන අරමුණු ලභාකර ගැනීමේ ඉලක්ක හා දර්ශක 62

6. මානව සම්පත් පැතිකඩ 67

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය 67

6.2. සේවක අතිරික්තය හෝ සේවක හිඟය ආයතනයේ කාර්යසාධනයට බලපාන ආකාරය 67

6.3. මානව සම්පත් සංවර්ධනය 68

7. අනුකූලතා වාර්තාව 71

7.1. අනුකූලතා වාර්තාව 71

8. විගණකාධිපති නිරීක්ෂණ 79

8.1 විගණකාධිපති නිරීක්ෂණ 79

1.0 ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍යවරයාගේ නිල රාජකාරී කටයුතු සිදුකරන අග්‍රාමාත්‍ය කාර්යාලය, රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව ආර්ථික හා සමාජීය සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම උදෙසා අවශ්‍ය මඟපෙන්වීම, සම්බන්ධීකරණය හා නායකත්වය ලබා දීම සිදුකරනු ලබයි.

එමෙන්ම, කාලීන අභියෝග හමුවේ නොබියව, තිර අදිටනින් යුතුව එම අභියෝග සඳහා කඩිනම් පිළියම් යෙදීමටත්, ජනතාවගේ අපේක්ෂාවන් සඵල කර දීම සඳහා දුෂ්කර කාල සීමාවන්හි, ඔවුන් වෙනුවෙන් පෙනී සිටිමින් එකී අපේක්ෂාවන් ඉටුකිරීමට අවශ්‍ය නායකත්වය ලබා දීම අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් සිදු කරනු ලබයි. තවද, රටේ සංවර්ධන කාර්ය සඵල කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ජනතා කේන්ද්‍රීය ප්‍රවේශයක් තුළින් තිරසර ලෙස රටේ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය දායකත්වය, මඟපෙන්වීම හා මනා සම්බන්ධීකරණයක් සැපයීම හා ගෝලීය අන්‍යෝන්‍ය සබඳතා පුළුල් කිරීමේ අරමුණින් රාජ්‍යතාන්ත්‍රික කටයුතු සම්බන්ධයෙන් දායකත්වය සැපයීමත්, අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් නිරන්තරවම සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 15වන අග්‍රාමාත්‍යවරයා ලෙස ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා කටයුතු කරනු ලබයි. 2022 වර්ෂය තුළ අග්‍රාමාත්‍යවරුන් තිදෙනකු (03) අග්‍රාමාත්‍ය ධුරයේ කටයුතු කරනු ලැබ ඇත.

- ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා - 2022.08.09 - 2022.05.09
- ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා - 2022.05.12 - 2022.07.20
- ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා - 2022.07.22 සිට

1.2 ආයතනික දැක්ම හා මෙහෙවර

❖ ආයතනික දැක්ම

"ස්වාධීන, ස්වෛරී හා සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක්"

❖ ආයතනික මෙහෙවර

"ශ්‍රී ලාංකීය ජනතාවගේ අපේක්ෂාවන් මල්ඵල ගැන්වීම පිණිසත්, ඔවුන්ගේ ජීවන තත්ත්වය නංවාලීම පිණිසත් රාජ්‍ය, විදේශ දූත මණ්ඩල, එක්සත් ජාතින් හා රාජ්‍ය නොවන ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින්, යහපාලනයෙන් යුත් විශිෂ්ට රාජ්‍ය යාන්ත්‍රණයක් උදෙසා අවැසි නායකත්වය සැපයීම"

1.3. ප්‍රමුඛතා

- රජයේ ප්‍රතිපත්ති සහ තීරණ ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම් ලබාදීම

- අග්‍රාමාත්‍යවරයා මුලසුන හොබවන විවිධ කමිටු හා රැස්වීම් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම, සම්බන්ධීකරණය හා ඒවායේ ප්‍රගතිය පසුවිපරම් කිරීම

- අග්‍රාමාත්‍යවරයාගෙන් පාර්ලිමේන්තුවේදී විමසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු සැකසීම

- අග්‍රාමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට යොමු කරන පනත් කෙටුම්පත්වලට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම

- අග්‍රාමාත්‍ය ලේකම්වරයා මුලසුන හොබවන විවිධ කමිටු හා රැස්වීම් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම, සම්බන්ධීකරණය හා ප්‍රගතිය පසු විපරම් කිරීම

- අග්‍රාමාත්‍ය ලේකම්වරයා නියෝජනය කරනු ලබන විවිධ කමිටු හා රැස්වීම් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම, සම්බන්ධීකරණය හා ප්‍රගතිය පසු විපරම් කිරීම

- සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති සාක්ෂාත් කර ගැනීම සඳහා විවිධ රාජ්‍ය ආයතනයන් මඟින් දියත් කරනු ලබන සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති සම්බන්ධීකරණය, මාර්ගෝපදේශනය, අධීක්ෂණය හා පසුවිපරම් කිරීම

- අග්‍රාමාත්‍යවරයාට රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා පැවැත්වීමට සහ ඒවා වර්ධනය කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීම

- අග්‍රාමාත්‍යවරයාගේ විදේශ සංචාර සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය හා මෙහෙයවීම

- ජාතික හා ආගමික උත්සව සහ සමාජ සත්කාරක සේවාවන් රාජ්‍ය අනුග්‍රහය සහිතව සංවිධානය කිරීම

- අග්‍රාමාත්‍යවරයා වෙත යොමු කරන මහජන පැමිණිලි හා දුක්ගැනවිලි, අදාළ ආයතන වෙත යොමු කර සහන සැලසීමට අවශ්‍ය කටයුතු කිරීම

- අග්‍රාමාත්‍ය කාර්යාලය, අරලියගහ මන්දිරය සහ අග්‍රාමාත්‍යවරයාගේ නිල නිවාස නිසි පරිදි නඩත්තු කර පවත්වාගෙන යාම

- අග්‍රාමාත්‍ය කාර්යාලයේ දෛනික පරිපාලන හා සංවර්ධන කටයුතු ඉටුකිරීම

- අග්‍රාමාත්‍යවරයා සහභාගීවන රාජ්‍ය හා ජාතික උත්සව සහ විශේෂ අවස්ථා සඳහා මාධ්‍ය ආවරණය සැපයීම

1.4 අග්‍රාමාත්‍ය කාර්යාලයේ සංවිධාන ව්‍යුහය



2.0 ප්‍රගතිය හා අනාගත දැක්ම

2.1 ප්‍රතිපත්ති සම්පාදනය

ආර්ථික, සමාජීය හා දේශපාලනික ක්ෂේත්‍රයන්හි කාලීන අභියෝගයන්ට අදාළව ගරු අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් හෝ අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන රැස්වීම්, සාකච්ඡා හා හමුවීම් සංවිධානය කිරීම මෙන්ම එම අවස්ථාවන්හිදී ගනු ලබන තීරණ පසු විපරම් කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීමත්, විවිධ සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතිවලට අදාළව විදේශීය රාජ්‍යයන් සහ ආයතන සමඟ අග්‍රාමාත්‍යවරයා වෙනුවෙන් අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු ද, විදේශ ආයෝජන දිරිමත් කිරීම ද අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් සිදු කරනු ලබයි.

විවිධ විදේශීය රාජ්‍යයන් සහ ආයතන සමඟ සංවර්ධන උපායමාර්ග සහ දේශීය සංවර්ධන උපාය මාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීමට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමත්, රටේ ආර්ථික ස්ථාවරත්වය ඇති කිරීම සඳහා අධ්‍යයන හා පර්යේෂණ කමිටු (Think Tank) ඇති කිරීම සහ සම්බන්ධීකරණය කිරීමත්, ආදායම් සහ විදේශ විනිමය උත්පාදන යෝජනා විශ්ලේෂණය හා ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය කරමින්, සුවිශේෂී ඉලක්ක අරභයා විශේෂ කාර්යසාධන කමිටු පිහිටුවීම හා සම්බන්ධීකරණය සිදු කිරීමත් මෙම කාර්යාලය මඟින් සිදු කරනු ලබයි. තවද, ගරු අග්‍රාමාත්‍යතුමා විසින් රාජතාන්ත්‍රිකව යොමු කරනු ලබන ලිපි, සංදේශ සහ වාර්තා සකස් කිරීම සහ එයට අදාළව පසුවිපරම් කටයුතු සිදු කිරීමත්, ගරු අග්‍රාමාත්‍යවරයා වෙත පෞද්ගලිකව ලැබෙන ලිපි හා අග්‍රාමාත්‍ය ලේකම් වෙත ලැබෙන විශේෂ අවධානය යොමු කළ යුතු ලිපි පිළිබඳව කටයුතු කිරීමත් සිදු කරනු ලබයි.

2022 වර්ෂයේ ආර්ථික සංවර්ධන විෂය ක්ෂේත්‍රයට අදාළව සිදු කරන ලද කාර්යභාරය

- බලශක්ති ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති, උපායමාර්ග හා ඉලක්ක නිර්දේශ කිරීම සඳහා වන අමාත්‍ය මණ්ඩල අනුකමිටුවේ සම්බන්ධීකරණ කටයුතු

- අඛණ්ඩව ගෑස් සැපයුම පවත්වාගෙන යෑම පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටුවේ සම්බන්ධීකරණ කටයුතු

- විවිධ සංවර්ධන උපාය මාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීමට අදාළ සම්බන්ධීකරණ කටයුතු

- මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණය සහ කඩිනම් කිරීම (RAMP) සඳහා වූ අමාත්‍ය මණ්ඩලය මඟින් පත් කළ කමිටුවට අදාළ කටයුතු

- දේශීය හා විදේශීය අදායම් උත්පාදන යෝජනා විශ්ලේෂණය සහ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම

- සුවිශේෂී ඉලක්ක අරභයා විශේෂ කාර්යසාධන කමිටු පිහිටුවීම හා අදාළ සම්බන්ධීකරණය

- අනෙකුත් අමාත්‍ය මණ්ඩල අනුකමිටු හා අදාළ සම්බන්ධීකරණ කටයුතු

- ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය පිළිබඳ තාක්ෂණික උපදේශක කමිටුව සම්බන්ධීකරණය

- ආහාර සුරක්ෂිතතා කඩිනම් ජාතික මෙහෙයුම - ධිවර හා පශු සම්පත් ජාතික කමිටුව හා අදාළ කටයුතු

- ජීවනෝපාය හා විශේෂ ආර්ථික වැඩසටහන් සඳහා මඟ පෙන්වීම හා පහසුකම් සැපයීම

- විවිධ විෂය ක්ෂේත්‍රයන්හි නියැලෙන වෘත්තිකයන්ගේ වෘත්තිය ගැටලු විසඳීමට මැදිහත් වීම

- චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම හා අදාළ කටයුතු

- රජයේ ව්‍යවස්ථාපිත ආයතන, සංස්ථා හා මණ්ඩල ආදිය සඳහා වන නිලධාරීන් පත් කිරීම් හා අදාළ නිර්දේශ ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ කමිටුවට අදාළ කටයුතු

2.2 සංවර්ධන කටයුතු සඳහා මැදිහත්වීම

ජාතික ආර්ථික හා සමාජීය සංවර්ධන වැඩසටහනට අනුකූලව එම වැඩසටහන් ජාතික සංවර්ධන ඉලක්ක කරා යොමු වන අයුරින් මහජනතාවට කඩිනමින් එහි ප්‍රතිලාභ හිමිවන පරිදි මෙහෙය වීම සඳහා ගරු අග්‍රාමාත්‍යවරයා හෝ අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ මහපෙන්වීම හා මූලිකත්වය යටතේ 2022 වර්ෂය තුළ පහත සඳහන් කාර්යයන් ඉටු කරන ලදී.

- අග්‍රාමාත්‍යවරයා/ අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් කාර්යක්ෂම කිරීම උදෙසා රැස්වීම් හා වැඩසටහන් සංවිධානය
- රැස්වීම් හා සාකච්ඡාවලදී ගනු ලබන තීරණ ආශ්‍රිත පසුවිපරම් කිරීම
- රැස්වීම් හා වැඩසටහන් සඳහා අවශ්‍ය වන පරිදි පසුබිම් හා ශක්‍යතා අධ්‍යයනයන් සිදුකිරීම
- විවිධ පාර්ශව වලින් අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත යොමු වන ලිපි ආශ්‍රිත කටයුතු හා නියාමනයන් සිදුකිරීම
- අග්‍රාමාත්‍යවරයා නිල බලයෙන් සභාපතිත්වය දරන පාලක සභාවන්හි රැස්වීම් හා ප්‍රගති සමාලෝචනය
- අග්‍රාමාත්‍ය කාර්යාලය ක්ෂේත්‍රගතව හා විවිධ අමාත්‍යාංශ මඟින් පවත්වනු ලබන සම්මේලන, සම්මන්ත්‍රණ හා උත්සව ආශ්‍රිත සම්බන්ධීකරණ හා සංවිධාන කටයුතු සිදුකිරීම
- අන්තර් අමාත්‍යාංශ අතර සම්බන්ධීකරණ ව්‍යාපෘතිවලදී තුන්වන පාර්ශවයක් ලෙස අවශ්‍ය මැදිහත් වීම සහ සම්බන්ධීකරණය සිදු කිරීම

ඒ අනුව, ගරු අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලබන රැස්වීම් සංවිධානය කිරීම හා එම රැස්වීම් තුළදී සාකච්ඡා කරනු ලැබූ කරුණු හා ගනු ලැබූ තීරණයන්ට අදාළව සාකච්ඡා සටහන් වගකිව යුතු ආයතන වෙත යොමු කිරීම හා ඒ පිළිබඳව පසුවිපරම් කටයුතු සිදුකිරීම ද සිදුකරන ලදී.

ගරු අග්‍රාමාත්‍යවරයාගේ උපදේශනය හා මාර්ගෝපදේශකත්වය යටතේ විවිධ ක්ෂේත්‍රයන්ට අදාළව පවත්වන ලද රැස්වීම් හා සාකච්ඡා

(2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා)

#	රැස්වීම	පැවැත්වූ දිනය	එලැඹී තීරණ/ පසුවිපරම් කළ කරුණු
1.	රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සමඟ පවත්වන ලද සාකච්ඡාව	2022.01.04	05
2.	ලෝක උරුම සීගිරිය නව නගරය විධිමත් ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ සාකච්ඡාව	2022.01.11	07
3.	මධ්‍යම සංස්කෘතික අරමුදලේ තනතුරු ආශ්‍රිතව මතුව ඇති ගැටලු පිළිබඳ සාකච්ඡාව	2022.01.12	01
4.	ලෝක උරුම සීගිරිය නව නගරය විධිමත්ව ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ මූලික සාකච්ඡාවේදී ගනු ලැබූ තීරණවලට අදාළ ප්‍රගතිය සමාලෝචන සාකච්ඡාව	2022.01.27	14
5.	තරුණ තරුණියන් සඳහා විදේශ රැකියා අවස්ථා නිර්මාණය කර දීම පිළිබඳ විශේෂ සාකච්ඡාව	2022.01.31	12
6.	රාජ්‍ය සේවා එක්සත් හෙද සංගමයේ නිලධාරීන් සමඟ පවත්වනු ලැබූ සාකච්ඡාව	2022.02.14	07
7.	නාගරික පුනර්ජනන වැඩසටහන සහ කොළඹ නාගරික පුනර්ජනන වැඩසටහන - ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡාව	2022.02.23	09
8.	ගරු අග්‍රාමාත්‍යවරයා අමාත්‍යධුර දරන අමාත්‍යාංශවල ලේකම්වරු හා ආයතන ප්‍රධානීන් සමඟ පවත්වන ලද ප්‍රගති සමාලෝචන සාකච්ඡාව	2022.03.08	-
9.	ආබාධිතතාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡාව	2022.03.09	10
10.	සමස්ත ලංකා තෙළිඟු ශිල්පීන්ගේ සංස්කෘතික සංගමය සමඟ පවත්වන ලද සාකච්ඡාව	2022.03.11	11
11.	මිහින්තලේ වෙළඳ නගර ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡාව	2022.03.24	08
12.	ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ ප්‍රගති සමාලෝචන රැස්වීම	2022.03.25	-

#	රැස්වීම	පැවැත්වූ දිනය	එලැඹී තීරණ/ පසුවිපරම් කළ කරුණු
13.	ශ්‍රී සාලවන බෝධි මහා විහාරස්ථානයේ අභිනව ධාතු මන්දිරය සහිත සීමා මාලකය සම්බුද්ධ ශාසනයට පූජා කිරීමේ මහෝත්සවය පිළිබඳ මූලික සාකච්ඡාව	2022.03.29	07
14.	වත්මන් ආර්ථික අභියෝග පිළිබඳ විද්වත් සාකච්ඡාව	2022.03.29	-
15.	යෝජිත චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ මෙරට පාර්ශව සමඟ පවත්වන ලද දෙවන වටයේ සාකච්ඡාව	2022.04.26	04
16.	රටේ වත්මන් ආර්ථික තත්ත්වය පිළිබඳ විශේෂ සාකච්ඡාව	2022.05.14	03
17.	ශ්‍රී ලංකා ආහාර ආනයනකරුවන්ගේ සහ වෙළඳුන්ගේ ගැටලු පිළිබඳ සාකච්ඡාව	2022.05.14	02
18.	අත්‍යාවශ්‍ය සේවා සැපයීම පිළිබඳ සාකච්ඡාව	2022.05.15	05
19.	අත්‍යාවශ්‍ය සේවා සැපයීම පිළිබඳ සාකච්ඡාව	2022.05.16	11
20.	අත්‍යාවශ්‍ය සේවා සැපයීම පිළිබඳ සාකච්ඡාව	2022.05.17	04
21.	කෘෂිකර්මාන්ත, පොහොර හා වැවිලි ක්ෂේත්‍රයේ ගැටලු පිළිබඳ සාකච්ඡාව	2022.05.17	05
22.	කෘෂිකර්මාන්ත, පොහොර හා වැවිලි ක්ෂේත්‍රයේ ගැටලු පිළිබඳ සාකච්ඡාව	2022.05.18	03
23.	ආහාර සුරක්ෂිතතාවය, කෘෂි කර්මාන්ත, පොහොර හා වැවිලි ක්ෂේත්‍රයේ ගැටලු පිළිබඳ සාකච්ඡාව	2022.05.23	13
24.	ආර්ථික පුනර්ජීවනය සහ අයවැය පිළිබඳ සාකච්ඡාව	2022.05.23	06
25.	ඉන්දියානු ණය යෝජනා ක්‍රමය පිළිබඳ සාකච්ඡාව	2022.05.23	04
26.	බැංකුකරුවන් සමඟ පැවති විශේෂ සාකච්ඡාව	2022.05.26	04
27.	බෝග වගාව හා කෘෂිකර්ම ප්‍රවර්ධන කමිටු සාකච්ඡාව	2022.05.27	16
28.	කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ ගැටළු පිළිබඳ සාකච්ඡාව	2022.05.27	04

#	රැස්වීම	පැවැත්වූ දිනය	එලැඹී තීරණ/ පසුවිපරම් කළ කරුණු
29.	නාගරික කෘෂිකර්ම කටයුතු ප්‍රවර්ධන අනු කමිටුවේ සාකච්ඡාව	2022.05.27	06
30.	මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ පැවති සාකච්ඡාව	2022.05.30	11
31.	ඉන්ධන සැපයීම සඳහා ප්‍රමාණවත් විදේශ විනිමය සපයා ගැනීම පිළිබඳ සාකච්ඡාව	2022.05.31	09
32.	ඒකාබද්ධ වාණිජ මණ්ඩල සමඟ පැවති සාකච්ඡාව	2022.06.02	-
33.	ගෑස් අර්බුදය සඳහා විසඳුම් පිළිබඳ සාකච්ඡාව	2022.06.05	02
34.	ආර්ථික තත්ත්වය ආශ්‍රිතව කඩිනමින් ගතයුතු පියවර් පිළිබඳ සාකච්ඡාව	2022.06.05	01
35.	ඉන්ධන අර්බුදයට විසඳුම් පිළිබඳ සාකච්ඡාව	2022.06.05	01
36.	කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ වර්තමාන ගැටලු පිළිබඳ සාකච්ඡාව	2022.06.06	12
37.	ඉන්දියානු ණය පහසුකම පිළිබඳව අදාළ නිලධාරීන් සමඟ පැවැත්වූ සාකච්ඡාව	2022.06.06	03
38.	ඉන්දියානු ණය පහසුකම පිළිබඳව අදාළ නිලධාරීන් සමඟ පැවැත්වූ පසුවිපරම් සාකච්ඡාව	2022.06.08	03
39.	ඉදිකිරීම් කර්මාන්තයේ පවතින ගැටලු පිළිබඳ සාකච්ඡාව	2022.06.14	01
40.	සංචාරක කර්මාන්තය මුහුණ දෙමින් සිටින ගැටලු පිළිබඳ සාකච්ඡාව	2022.06.14	-
41.	ලංකා රසකැවිලි නිෂ්පාදකයින්ගේ සංගමය සමඟ පැවති සාකච්ඡාව	2022.06.14	01
42.	හාල්මෝල් හිමියන්ගේ ණය ගැටලුව පිළිබඳ සාකච්ඡාව	2022.06.15	06
43.	ඉන්දියානු ණය පහසුකම පිළිබඳ අදාළ නිලධාරීන් සමඟ පැවැත්වූ පසුවිපරම් සාකච්ඡාව	2022.06.15	03
44.	ඉන්දියානු ණය පහසුකම පිළිබඳ අදාළ නිලධාරීන් සමඟ පැවැත්වූ පසුවිපරම් සාකච්ඡාව	2022.06.16	06
45.	ආහාර සුරක්ෂිතතාවය පිළිබඳව සාකච්ඡාව	2022.06.17	28

#	රැස්වීම	පැවැත්වූ දිනය	එලැඹී තීරණ/ පසුවිපරම් කළ කරුණු
46.	ශ්‍රී ලංකා ගුවන් සමාගම සමඟ පැවති සාකච්ඡාව	2022.06.17	-
47.	ඉන්ධන සහ ගෑස් කමිටුවේ සමාලෝචන රැස්වීම	2022.06.18	05
48.	ආර්ථික සහයෝගිතාවය සඳහා වූ ක්‍රියාකාරකම් පිළිබඳ සාකච්ඡාව	2022.06.23	07
49.	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ නියෝජිතයින් සමඟ පැවති සාකච්ඡාව	2022.06.23	-
50.	කිරි ආශ්‍රිත නිෂ්පාදකයන්ගේ ගැටලු පිළිබඳ සාකච්ඡාව	2022.06.27	12
51.	ලෝක ආහාර වැඩසටහනේ නිලධාරීන් සමඟ සාකච්ඡාව	2022.06.27	9
52.	ආහාර සුරක්ෂිතතාවය පිළිබඳව දිස්ත්‍රික් ලේකම්වරුන් සමඟ පැවති සාකච්ඡාව	2022.06.29	4
53.	බැංකු සහ අපනයනකරුවන්ගේ සංගම් සමඟ පැවති සාකච්ඡාව	2022.07.04	-
54.	ඇඟලුම් කර්මාන්තය පිළිබඳ සාකච්ඡාව	2022.07.05	-
55.	බැංකුකරුවන් සමඟ පැවති සාකච්ඡාව	2022.07.06	02
56.	ධීවර ක්ෂේත්‍රය මුහුණ දෙමින් සිටින ගැටලු පිළිබඳ සාකච්ඡාව	2022.07.08	10
57.	බලශක්ති ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති හා උපායමාර්ග නිර්දේශ කිරීම සඳහා වන අමාත්‍ය මණ්ඩල අනුකමිටු සාකච්ඡාව-I	2022.09.13	01
58.	වී මිළදී ගැනීම සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලු පිළිබඳ සාකච්ඡාව	2022.09.21	04
59.	අඛණ්ඩව ගෑස් සැපයුම පවත්වාගෙන යෑම පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටු රැස්වීම	2022.09.23	04
60.	බලශක්ති අර්බුදය හමුවේ විකල්ප බලශක්ති භාවිතා කර පොදු ප්‍රවාහන සේවය ශක්තිමත් කිරීම සම්බන්ධ සාකච්ඡාව	2022.10.04	03

#	රැස්වීම	පැවැත්වූ දිනය	එලැඹී තීරණ/ පසුවිපරම් කළ කරුණු
61.	බලශක්ති ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති හා උපායමාර්ග නිර්දේශ කිරීම සඳහා වන අමාත්‍ය මණ්ඩල අනුකමිටුව	2022.10.19	-
62.	බලශක්ති ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති හා උපායමාර්ග නිර්දේශ කිරීම සඳහා වන අමාත්‍ය මණ්ඩල අනුකමිටු සාකච්ඡාව II	2022.11.03	11
63.	කැළණිය, මුදුන්ඇළ පිහිටි ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සතු ඉඩම් කොටසක විෂ්ණු දේවාලයක් ඉදිකිරීම පිළිබඳ පවත්වන ලද සාකච්ඡාව	2022.11.24	01
64.	විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජාව වෙනුවෙන් පහසුකම් සැලසීම සඳහා වන ජාතික වැඩසටහන	2022.12.22	14

2.3 විවිධ සංවිධාන හා මහජනතාව විසින් කරනු ලබන ඉල්ලීම් සඳහා මැදිහත්වීම

ගරු අග්‍රාමාත්‍යවරයා වෙත විවිධ සංවිධාන, ආයතන සහ පුද්ගලයින් විසින් රැස්වීම් හෝ සාකච්ඡාවන් සඳහා කරනු ලබන ඉල්ලීම්වල සැබෑ අවශ්‍යතාවය හඳුනා ගැනීම, අවශ්‍ය අවස්ථාවලදී ශක්‍යතා අධ්‍යයනයන් සිදුකිරීම තුළින් අග්‍රාමාත්‍යවරයාගේ/අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් රැස්වීම් හෝ සාකච්ඡා සංවිධානය කිරීම හා රැස්වීම් වාර්තා පිළියෙල කිරීම හා පසුවිපරම් කටයුතු සිදුකරයි. තවද, අග්‍රාමාත්‍යවරයා/අග්‍රාමාත්‍ය ලේකම්වරයා වෙත විශේෂ අවධානය යොමු කරවමින් රාජ්‍ය ආයතන නියෝජනය කරන දේශපාලන අධිකාරිය විසින් යොමු කරනු ලබන ඉල්ලීම් ලිපි සම්බන්ධයෙන් කටයුතු කිරීමත් සිදු කරයි. ඒ අනුව, 2022 වර්ෂය තුළදී පහත සඳහන් ආකාරයට මැදිහත් වීම් සිදු කර ඇත.

- සංවිධානය කළ රැස්වීම් හෝ සාකච්ඡා සංඛ්‍යාව - 95
- සිදු කළ ශක්‍යතා අධ්‍යයන සංඛ්‍යාව (Feasibility Study) - 19
- සමස්තයක් ලෙස සිදුකළ මැදිහත්වීම් සංඛ්‍යාව - 2552



රජයේ ව්‍යවස්ථාපිත ආයතන, සංස්ථා සහ මණ්ඩලවල නිලධාරී පත්කිරීම්වලට අදාළව අග්‍රාමාත්‍යවරයා විසින් සිදු කරනු ලබන නිර්දේශයන් ජනාධිපති කාර්යාලය වෙත යොමු කිරීමත්, අග්‍රාමාත්‍යතුමා/අග්‍රාමාත්‍ය ලේකම් හමුවීමට පැමිණෙන විශේෂ පුද්ගලයින් සමඟ සාකච්ඡා කර අදාළ ඉල්ලීම් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකරන ලදී.

2022.08.26 දින සිට 2022.12.31 දින දක්වා ගරු අග්‍රාමාත්‍යවරයාගේ සහ අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත් වූ රැස්වීම්

#	රැස්වීම	පැවැත්වූ දිනය
1.	මධ්‍යම සංස්කෘතික අරමුදලේ නියෝජිතයින් සමග පැවැත්වූ සාකච්ඡාව	2022.08.26
2.	ආහාර සුරක්ෂිතතා කඩිනම් ජාතික මෙහෙයුම (ධීවර හා පශු සම්පත් ජාතික කමිටුව)	2022.08.29
3.	මහා පරිමාණ ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය සහ වේගවත් කිරීම පිළිබඳ සාකච්ඡාව (RAMP –I)	2022.09.13
4.	මෙගා ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය සහ වේගවත් කිරීම පිළිබඳ සාකච්ඡාව (RAMP –II)	2022.09.21
5.	වී මිළදී ගැනීම සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලු පිළිබඳ සාකච්ඡාව	2022.09.21
6.	අඛණ්ඩව ගෑස් සැපයුම පවත්වාගෙන යාම පිළිබඳව පත් කළ අමාත්‍ය මණ්ඩල අනුකමිටු සාකච්ඡාව	2022.09.23
7.	ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය පිලිබඳ තාක්ෂණික උපදේශක කමිටුව - I	2022.09.26
8.	වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධ සාකච්ඡාව	2022.10.03
9.	අඛණ්ඩව ගෑස් සැපයුම් පවත්වාගෙන යාම පිළිබඳ පත් කළ අමාත්‍යමණ්ඩල අනු කමිටුව	2022.10.04
10.	මෙගා ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය හා වේගවත් කිරීම පිළිබඳ සාකච්ඡාව - III	2022.10.04
11.	අඛණ්ඩව ගෑස් සැපයුම් පවත්වාගෙන යාම පිළිබඳ පත් කළ අමාත්‍ය මණ්ඩල අනු කමිටුව	2022.10.05
12.	මෙගා ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය හා වේගවත් කිරීම පිළිබඳ සාකච්ඡාව IV	2022.10.06
13.	අඛණ්ඩව ගෑස් සැපයුම් පවත්වාගෙන යාම පිළිබඳ පත් කළ අමාත්‍ය මණ්ඩල අනු කමිටුව	2022.10.06
14.	මෙගා ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය හා වේගවත් කිරීම පිළිබඳ සාක්ච්ඡාව V	2022.10.12
15.	Steering Committee Meeting on Sustainable Development Goals	2022.10.13
16.	මෙගා ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය හා වේගවත් කිරීම පිළිබඳසාකච්ඡාව VI	2022.10.18
17.	මෙගා ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය හා වේගවත් කිරීම පිළිබඳ සාකච්ඡාව VII	2022.10.21
18.	මෙගා ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය හා වේගවත් කිරීම පිළිබඳ සාකච්ඡාව VIII	2022.10.25
19.	කල්පිටිය මුහුදු ආශ්‍රිතව අනිසි ධිවර කටයුතු මඟින් සිදුවන කොරල්පර හානිය පිළිබඳ සාකච්ඡාව	2022.10.28
20.	මෙගා ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය හා වේගවත් කිරීම පිළිබඳ සාකච්ඡාව IX	2022.10.31

#	රැස්වීම	පැවැත්වූ දිනය
21.	මෙගා ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය හා වේගවත් කිරීම පිළිබඳ සාකච්ජාව X	2022.11.02
22.	මෙගා ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය හා වේගවත් කිරීම පිළිබඳ සාකච්ජාව XI	2022.11.04
23.	මෙගා ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය හා වේගවත් කිරීම පිළිබඳ සාකච්ජාව XII	2022.11.08
24.	මෙගා ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය හා වේගවත් කිරීම පිළිබඳ සාකච්ජාව XIII	2022.11.10
25.	මෙගා ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය හා වේගවත් කිරීම පිළිබඳ සාකච්ජාව XIV	2022.11.11
26.	ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය පිළිබඳ තාක්ෂණික උපදේශක කමිටු රැස්වීම 02	2022.11.15
27.	මෙගා ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය/බිංගිරිය, හම්බන්තොට එරාවුර් කර්මාන්ත පුරවරය	2022.11.18
28.	ජල පෝෂක කළමනාකරණය සඳහා සුදුසු ක්‍රමවේද සකස් කිරීම පිළිබඳ සාකච්ජාව	2022.11.22
29.	මිරිදිය මත්ස්‍ය වගාව ඉහළ නැංවීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග හඳුනාගැනීම	2022.11.30
30.	Progress review meeting on the contribution of the private sector, Government Organization and civil Organization to the Sustainable Development Goals	2022.12.08
31.	මෙගා ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය හා වේගවත් කිරීම පිළිබඳ සාකච්ජාව - XV	2022.12.21
32.	Meeting between Hon. Prime Minister and ambassador at France	2022.12.22
33.	Meeting between Hon. Prime Minister and Newly appointed SL envoys	2022.12.26

2.4 කාලීන ජාතික අවශ්‍යතාවයන් සඳහා දායකත්වය

❖ **ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය පිළිබඳ තාක්ෂණික උපදේශක කමිටුව**

ආහාර සුරක්ෂිතතාවය තහවුරු නොකරන්නේ නම් උග්‍ර මන්දපෝෂණ තත්ත්වයකට මෙරට ජනගහනයේ විශාල ප්‍රතිශතයක් ගොදුරු විය හැකි බවට එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් අනතුරු අඟවා ඇත. එබැවින්, මෙම අභියෝගයට විසඳුම් පිණිස ඒකාබද්ධ ප්‍රවේශයක් ඔස්සේ රාජ්‍ය, පෞද්ගලික, රාජ්‍ය නොවන, එක්සත් ජාතීන් යන අංශවල සක්‍රීය දායකත්වයෙන් ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය සහතික කිරීම සහ ආර්ථික පුනර්ජීවන කේන්ද්‍ර සවිබල ගැන්වීම මැයෙන් ගරු ජනාධිපතිවරයා සහ ගරු අග්‍රාමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශවලට ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ස්ථාපිත ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය පිළිබඳ බහු ආංශික ඒකාබද්ධ යාන්ත්‍රණයෙහි ආහාර සුරක්ෂිතතා සහ පෝෂණය වැඩසටහන්වල තාක්ෂණික මට්ටමේ සම්බන්ධීකරණය අග්‍රාමාත්‍ය ලේකම්වරයා සභාපතිත්වය දරන ‘‘ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය පිළිබඳ තාක්ෂණික උපදේශක කමිටුව’’ මඟින් සිදු කරනු ලබයි.

❖ **සංවර්ධන උපායමාර්ග සහ ජීවනෝපාය සංවර්ධනය**

විවිධ විදේශීය රාජ්‍යයන් හා ආයතන සමඟ සංවර්ධන උපායමාර්ග සහ දේශීය සංවර්ධන උපාය මාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීමට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම, රටේ ආර්ථික ස්ථාවරත්වය ඇති කිරීම සඳහා අධ්‍යයන හා පර්යේෂණ කමිටු (Think Tank) ඇති කිරීම සහ සම්බන්ධීකරණය කිරීම, ආදායම් සහ විදේශ විනිමය උත්පාදන යෝජනා විශ්ලේෂණය සහ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම සහ සුවිශේෂී ඉලක්ක අරභයා විශේෂ කාර්යසාධන කමිටු පිහිටුවීම හා සම්බන්ධීකරණය කිරීම මඟින් මේ සඳහා මැදිහත්වීම සිදු කරනු ලබයි.

❖ **චීන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම**

වර්ෂ 2014 සැප්තැම්බර් මාසයේ සිට නිදහස් වෙළඳ ගිවිසුමක් පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ මහජන චීන සමූහාණ්ඩුව අතර සාකච්ඡා කිරීමට එකඟ විය. ඒ අනුව, යෝජිත චීන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (CSFTA) යටතේ මේ වනවිට සාකච්ඡා වාරයන් හයක් (06) පමණ පවත්වා ඇත. එනමුත්, වර්ෂ 2017 මාර්තු මාසයෙන් පසුව මේ දක්වා දෙරට අතර වෙනත් සාකච්ඡා වාරයන් පවත්වා නොතිබුණි.



චීනය සමඟ නිදහස් වෙළඳ ගිවිසුමකට එළැඹීම සඳහා වන සාකච්ඡා සම්මුති කඩිනමින් ආරම්භ කිරීමට හැකිවනු පිණිස අංක අමප/22/0576/402/003 හා 2022.04.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුතුව සාකච්ඡා සම්මුති කමිටුවක් පත් කර ඇත. මෙකී සාකච්ඡා සම්මුති කමිටුවෙහි ප්‍රධාන සාකච්ඡාකරු වශයෙන් අග්‍රාමාත්‍ය ලේකම් පත් කර ඇති බැවින්, චීන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් සිදු කරනු ලබයි. එමඟින් මෙරට නිෂ්පාදිත භාණ්ඩ සඳහා පවතින විදේශීය වෙළඳපොල පුළුල් කරගැනීමේ හැකියාව සහ මෙරට ජාත්‍යන්තර වෙළඳාම හා සම්බන්ධ තවත් සාධනීය ඉලක්ක රාශියක් මෙරට ආර්ථිකයට ළඟා කරගැනීමේ හැකියාව පවතී.

❖ **අඛණ්ඩව ගෑස් සැපයුම පවත්වාගෙනයාම පිළිබඳව පත් කළ අමාත්‍ය මණ්ඩල අනුකමිටුව**

දැනට රටේ උද්ගතව පවතින ගෑස් අර්බුදයට පිළියමක් ලෙස 2022.09.22 දිනැති අංක 22/1483/604/042/TBR දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඛණ්ඩව ගෑස් සැපයුම පවත්වාගෙන යාම පිළිබඳව ගරු අග්‍රාමාත්‍යවරයාගේ සභාපතීත්වයෙන් යුත් පස් (05) දෙනෙකුගෙන් සමන්විත අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් ස්ථාපිත කර ඇත.

❖ **ආහාර සුරක්ෂිතතා කඩිනම් ජාතික මෙහෙයුම**

ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික තත්ත්වය තුළ යෙදවුම්වල හිඟකම නිසා අපගේ ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය මුහුණ දී ඇති අභියෝග හමුවේ මෙරට ජනතාව පෝෂ්‍යදායී ආහාර සපයාගැනීමේ ගැටළුවලට මුහුණ දී ඇත. ඒ අනුව දරුවන්, කාන්තාවන් සහ ගැබිණි මව්වරුන් හට විශේෂයෙන් බලපා ඇති ප්‍රෝටීන අවශ්‍යතාවය සපුරා ගැනීමේ අභියෝගයට විසඳුම් පිණිස ඒකාබද්ධ ප්‍රවේශයක් ඔස්සේ සංවිධානය වන මාස 18ක කඩිනම් ජාතික මෙහෙයුම සාර්ථක කරගැනීම සඳහා ගරු අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් ‘‘ආහාර සුරක්ෂිතා ජාතික මෙහෙයුම් කමිටුව - ධීවර හා පශු සම්පත් ජාතික කමිටුව’’ ස්ථාපිත කර ඇති අතර, ඒ යටතේ ගනු ලබන තීරණ අනුව සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම සහ අදාළ පසු විපරම් කටයුතු කිරීම අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් සිදු කරනු ලබයි.





❖ **මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණය සහ කඩිනම් කිරීම**
(Restrategizing and Acceleration of Mega Projects – RAMP)

2022 වර්ෂයේ දෙවන කාර්තුව අවසන් වනවිට රේඛීය අමාත්‍යාංශ මඟින් මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති 260ක් ක්‍රියාත්මක කරනු ලැබූ අතර, විදේශ විනිමය ප්‍රමාණවත් නොවීම, ඉන්ධන, අමුද්‍රව්‍ය ආනයනය ප්‍රමාද වීම හා අග්‍රිම සීමාකම් නිසා එම ව්‍යාපෘතින්හි අපේක්ෂිත ප්‍රගතිය අත්කර ගැනීම ගැටලු සහගත වී ඇත.



එබැවින්, මෙම ගැටලුවලට කඩිනම් විසඳුම් ලබාදීමට හැකි බලතල සහිත නිලධාරි කමිටුවක් අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් අමාත්‍ය මණ්ඩලය මඟින් පත් කිරීමටත්, ප්‍රතිපාදන අවුරා ඇති දේශීය අරමුදල් මඟින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල ක්‍රියාකාරකම් යෝග්‍ය පරිදි අවසන් කිරීමට සහ නැවත ආරම්භ කිරීමට පෙර ඒවායෙහි ශක්‍යතාවය හා අවශ්‍යතාවය සමාලෝචනය කර අරමුදල් ලබාදීම සඳහා නැවත පුමුඛතාවය තීරණය කිරීමටත්, දැනටමත් තාවකාලිකව අත්හිටවූ ව්‍යාපෘතිවල කාර්ය මණ්ඩල පිළිබඳවත්, හා පවරාගෙන ඇති ඉඩම්,දේපල සහ ව්‍යාපෘති සම්පත් අනවසරයෙන් පුද්ගලයන් අත් කරගැනීම වැළැක්වීම සම්බන්ධව කඩිනම් පියවර ගැනීමටත්, මෙහිදී ප්‍රමුඛ අවධානය යොමු කරයි.



❖ **රජයේ පොදු ආකෘති පත්‍ර සමාලෝචන කමිටුව**

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කරනු ලබන පොදු අකෘති පත්‍ර සමාලෝචනය කර ඒවායේ ගුණාත්මකභාවය සහ ස්වරූපය නවීකරණය සඳහා පත් කර ඇති කමිටුව සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

2.5 සැලසුම්කරණය හා වාර්තාකරණය

❖ **අග්‍රාමාත්‍ය කාර්යාලයීය වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම**

2022 වර්ෂය සඳහා අදාළ ක්‍රියාකාරී සැලැස්ම නියමිත දින සකස් කර ඉදිරිපත් කරනු ලැබ ඇති අතර, වසරේ සියලු කාර්තු සඳහා ක්‍රියාකාරී සැලසුම් කාර්තු වශයෙන් සකස් කර නියමිත කාලවකවානු ඇතුළත ඉදිරිපත් කර ඇත.

❖ **අග්‍රාමාත්‍ය කාර්යාලයීය තිරසර සංවර්ධන අරමුණු (SDG) ලඟා කර ගැනීමේ කාර්යසාධන වාර්තාව සකස් කිරීම**

2017 අංක 19 දරන තිරසර සංවර්ධන (SDG) පනත ප්‍රකාරව සියලු ආයතන විසින් එක් එක් වර්ෂය සඳහා තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය ඉදිරිපත් කළ යුතුව ඇත. ඒ අනුව, 2021 වර්ෂය සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයීය තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේ කාර්යසාධන වාර්තාව නියමිත පරිදි සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත.

❖ **වාර්ෂික කාර්යසාධන වාර්තා කෙටුම්පත හා අවසන් කාර්ය සාධන වාර්තාව සැකසීම**

2002.09.12 දිනැති මුදල් චක්‍රලේඛ අංක 402හි 2.4 ඡේදයෙහි විධිවිධාන අනුව 2021 වර්ෂයේ අග්‍රාමාත්‍ය කාර්යාලයීය කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත විගණකාධිපති වෙත ද අවසන් කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ද නියමිත පරිදි ඉදිරිපත් කරනු ලැබ ඇත.

❖ **වාර්ෂික ප්‍රගති වාර්තාව සකස් කිරීම**

වර්ෂයේ පළමු කාර්තු ත්‍රිත්වය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම්හි ප්‍රගතිය ඇතුළත් 2022 වර්ෂය සඳහා වූ වාර්ෂික ප්‍රගති වාර්තාව භාෂා ත්‍රිත්වයෙන් යුක්තව සකස් කර පාර්ලිමේන්තුවේ අයවැය විවාදයේදී සභාගත කිරීම සඳහා නියමිත දිනට පෙර ඉදිරිපත් කර ඇත.

❖ **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව වර්ෂයේ සියලු කාර්තුමය ප්‍රගති වාර්තා සැකසීම**

අග්‍රාමාත්‍ය කාර්යාලයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා එක් එක් අංශයන් විසින් සිදු කරන්නා වූ ක්‍රියාකාරකම් හි ප්‍රගතිය මැන බැලීම වැදගත් වේ. එබැවින්, අග්‍රාමාත්‍ය කාර්යාලයේ කාර්තුමය වශයෙන් එක් එක් අංශයන් විසින් සිදු කරන්නා වූ ක්‍රියාකාරකම්හි ප්‍රගතිය මැන බැලීමේ අරමුණ ඇතිව, 2022.01.01 සිට 2022.12.31 දින දක්වා වූ කාල සීමාවට අයත් සියලුම කාර්තුමය ප්‍රගති වාර්තා සකස් කර නියමිත දිනට පෙර විගණන අංශය වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත.

2.6 පාර්ලිමේන්තු හා අමාත්‍ය මණ්ඩල කටයුතු

❖ **අමාත්‍ය මණ්ඩල සංදේශ/අමාත්‍ය මණ්ඩල සටහන් සම්බන්ධ කටයුතු**

ගරු අග්‍රාමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ/අමාත්‍ය මණ්ඩල සටහන් කෙටුම්පත් කර අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම දක්වා වූ ක්‍රියාවලිය හා සම්බන්ධීකරණය අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් සිදු කරනු ලබයි.

ඒ අනුව, 2022 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා විවිධ ක්ෂේත්‍රයන්ට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ 41ක් සහ අමාත්‍ය මණ්ඩල සටහන් 19ක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

❖ **අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සාරාංශ සටහන් පිළියෙල කිරීම**

අමාත්‍ය මණ්ඩල රැස්වීම් පැවැත්වීමට පෙර අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් සභාපතා ගරු අග්‍රාමාත්‍යවරයාගේ අවධානය සඳහා එවනු ලබන අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සියල්ලේමඇතුළත් කරුණු සාරාංශ කර එක් ලිපිගොනුවක් සකස් කර ගරු අග්‍රාමාත්‍යවරයා වෙත හා අග්‍රාමාත්‍ය ලේකම්වරයා වෙත ලබා දීමට කටයුතු කරනු ලබයි. ඒ අනුව, 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සාරාංශ සටහන් 43ක් සකස් කර ඇත.

❖ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සම්බන්ධ දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීම

සියලුම අමාත්‍යාංශ විසින් තම විෂය පථයට අදාළ කාර්යයන් සම්බන්ධව අමාත්‍ය මණ්ඩලයට යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ/සටහන්, ඊට අදාළ නිරීක්ෂණ හා තීරණ පරිලෝකනය කර (Scan) දත්ත පද්ධතියට ඇතුළත් කිරීම හා කාර්යාලයීය අවශ්‍යතා සඳහා යාවත්කාලීන කරන ලද තොරතුරු අදාළ නිලධාරීන්ට ලබා දීම සිදු කරනු ලබයි. ඒ අනුව, 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා යොමු කර ඇති සියලුම අමාත්‍ය මණ්ඩල සංදේශ/සටහන්, ඊට අදාළ නිරීක්ෂණ හා තීරණ දත්ත පද්ධතියට ඇතුළත් කර ඇත.

❖ යෝජනා සම්මත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

ගරු ජනාධිපතිතුමා විසින් ගැසට් මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන නීතිමය කාර්යයන් අවසන් කර ඇති පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් හා ගරු අග්‍රාමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු යෝජනා සම්බන්ධයෙන් යෝජනා සම්මත සකස් කර පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව, 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා යෝජනා සම්මත 13ක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

❖ පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම

ගරු ජනාධිපතිවරයාගේ හා ගරු අග්‍රාමාත්‍යවරයාගේ විෂය පථයට අදාළව විපක්ෂ හා ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් විසින් 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා කාලසීමාව ඇතුළත ගරු අග්‍රාමාත්‍යවරයා වෙතින් විමසන ලද වාචික ප්‍රශ්න අසූ හයක (86)කට අදාළ පිළිතුරු සපයා ඇත. ඒ අනුව,

- ගරු ජනාධිපතිවරයාගේ විෂය පථය යටතට අයත් අමාත්‍යාංශ හා ජනාධිපති කාර්යාලයට අයත් වන කරුණු සම්බන්ධයෙන් වාචික ප්‍රශ්න - 52

- ගරු අග්‍රාමාත්‍යවරයාගේ විෂය පථය යටතට අයත් අමාත්‍යාංශ හා අග්‍රාමාත්‍ය කාර්යාලයට අයත් වන කරුණු සම්බන්ධයෙන් වාචික ප්‍රශ්න - 34

- ජාතික වැදගත්කමකින් යුතු ප්‍රතිපත්තිමය කරුණු ඔස්සේ සෑම මසකම පාර්ලිමේන්තු රැස්වීම පැවැත්වෙන පළමු බදාදා දින අග්‍රාමාත්‍යවරයාගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාව යටතේ අසනු ලබන වාචික ප්‍රශ්න හතර (04)ක් සඳහා පිළිතුරු ලබා දීම සිදු කරනු ලබයි. ඒ අනුව, අවස්ථා දෙකකදි වාචික ප්‍රශ්න අටක (08)ට පිළිතුරු කෙටුම්පත් කර ඇත.

- සභාව කල් තැබීමේ යෝජනා හතර (04)ක් සඳහා පිළිතුරු ඉදිරිපත් කර ඇත.

- ස්ථාවර නියෝග 27(2) යටතේ අසනු ලබන ප්‍රශ්න පහ (05)ක් සඳහා පිළිතුරු ඉදිරිපත් කර ඇත.



❖ පාර්ලිමේන්තු වාර්තා සභාගත කිරීම

ගරු ජනාධිපතිවරයාගේ හා ගරු අග්‍රාමාත්‍යවරයාගේ විෂය පථය යටතට ගැනෙන විෂය කරුණු සම්බන්ධයෙන් වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු අවස්ථාවන්හි දී, විශේෂයෙන් වාර්ෂික වාර්තා, කාර්ය සාධන වාර්තා හා ගිණුම් ප්‍රකාශ යනාදි පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය කටයුතු අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් සිදු කරනු ලබන අතර, මේ වන විට පහත කරුණු යටතේ වාර්තා දාහතක් (17) පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. එම වාර්තා පහත පරිදි වේ.

- **පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ඉදිරිපත් කළ කාර්ය සාධන වාර්තා**
    - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව - 2020
    - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය - 2020
    - මුදල් කොමිෂන් සභාව - 2021
    - රාජ්‍ය සේවා කොමිෂන් සභාව - 2021
    - පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව - 2021
    - තාක්ෂණ අමාත්‍යාංශය - 2021
    - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව - 2021
    - මැතිවරණ කොමිෂන් සභාව - 2021
    - සීමා නිර්ණය කොමිෂන් සභාව - 2021
    - ජනාධිපති කාර්යාලය - 2021
    - උපරිමාධිකරණ විනිශ්චයකාරවරු - 2020 - 2021
    - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය - 2021

- **පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ඉදිරිපත් කළ වාර්ෂික වාර්තා**
    - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව -2016-2019
    - ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය -2016- 2018

- **ස්ථාවර නියෝග 119(4)**
    - මැතිවරණ කොමිෂන් සභාව

- **වෙනත්**
    - මැතිවරණ කොමිෂන් සභාව - 2020 වර්ෂයට පෙර පවත්වන ලද මැතිවරණ/ ඡන්ද විමසීම්වලට අදාළ වාර්තා
    - මැතිවරණ කොමිෂන් සභාව - 2020 වර්ෂයේ මැතිවරණ වාර්තා

2.7 නෛතික කටයුතු

ගරු අග්‍රාමාත්‍යවරයාගේ විෂය පථය යටතට ගැනෙන විවිධ නෛතික කාර්යයන්ට අදාළ සම්බන්ධීකරණ කටයුතු සහ ගරු අග්‍රාමාත්‍යවරයා විසින් අමාත්‍යධුර දරනු ලබන වෙනත් අමාත්‍යාංශවලට අදාළ නීතිමය කටයුතු සම්බන්ධීකරණය සිදු කර ඇති අතර, ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ හා වෙනත් අධිකරණයන්හි ගොනු කර ඇති ගරු අග්‍රාමාත්‍යවරයා සහ/හෝ අග්‍රාමාත්‍ය ලේකම්වරයා වගඋත්තරකරුවන් ලෙස නම් කරමින් පවරා ඇති නඩු කටයුතු සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව හා අනෙකුත් අදාළ පාර්ශවයන් සමඟ සම්බන්ධීකරණ කටයුතු ද සිදු කර ඇත.

- 2022 වර්ෂය තුළ නීති අංශය වෙත ලැබී ඇති නඩු පැවරීම්වලට අදාළ නොතීසි ප්‍රමාණයන් පහත පරිදි වේ.
    - ශ්‍රේෂ්ඨාධිකරණ නඩු ගොනු - 24
    - අභියාචනාධිකරණ නඩු ගොනු - 19

- සියලු නඩු ගොනු සම්බන්ධ කාර්යයන් සම්පූර්ණ කර ඇති අතර, අදාළ පෙරකලාසි නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. තවද, අවශ්‍ය අවස්ථාවලදී, ගරු නීතිපතිතුමා වෙත නිරීක්ෂණ හා පිළිතුරු ලබාදී ඇත.

- ගරු අග්‍රාමාත්‍යවරයා සහභාගී වන නීති කටයුතු සම්බන්ධයෙන් වන රැස්වීම් හා විශේෂ හමුවීම් ආදිය සම්බන්ධයෙන් කටයුතු කර ඇත.

- ගරු අග්‍රාමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සම්බන්ධයෙන් නීතිමය කටයුතු අවශ්‍ය පරිදි සිදු කර ඇත.

- අග්‍රාමාත්‍ය කාර්යාලයේ බද්දට ගැනීමට යෝජිත ගොඩනැඟිලි පරිශ්‍රයන්හි බදු ගිවිසුම් කෙටුම්පත් හා වෙනත් ගිවිසුම් කෙටුම්පත් විශ්ලේෂණය කර නිර්දේශ ඉදිරිපත් කර ඇත.

- නීති අංශය වෙත යොමු කරන ලද පොදු පැමිණිලි ඉදිරිපත් කරන තැනැත්තන්ට ඔවුන්ගේ ගැටලු සලකා බලා නීති උපදෙස් ලබා දීමට කටයුතු කර ඇති අතර, අදාළ ආයතනවලට එකී පැමිණිලි යොමුකර සොයා බලා පියවර ගන්නා ලෙස දැනුම් දී ඇත.

- නීති අංශය වෙත ඉදිරිපත් කරන ලද විවිධ ලිපිගොනු නිරීක්ෂණය කර ඊට අදාළ සටහන් සහ නිර්දේශ අදාළ අංශ වෙත ලබාදීමට කටයුතු කර ඇත.

- පහත සඳහන් පනත් කෙටුම්පත් සංශෝධනය කිරීම සහ නීති කෙටුම්පත් සැකසීම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සහ අදාළ අමාත්‍යාංශයන් සමඟ සම්බන්ධීකරණ කටයුතු කර ඇත.

    I. ගව ඝාතක පනත සහ සත්ව පනත සංශෝධනය කිරීමේ කෙටුම්පත
    II. 22 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය
    III. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතට අදාළ සංශෝධන (පළාත් සභා පනත, මහ නගර සභා පනත, නගර සභා ආඥාපනත සහ ප්‍රාදේශීය සභා පනත ඇතුළුව)

2.8 ආයතනික හා කාර්ය මණ්ඩල කටයුතු

අග්‍රාමාත්‍ය කාර්යාලයේ සමස්ත කාර්ය සාධනය ඉහළ ප්‍රමිතියකින් පවත්වාගෙන යාමට අවශ්‍ය මානව සම්පත කාර්යක්ෂම හා ඵලදායී ලෙස යොදා ගැනීම සඳහා අවශ්‍ය පරිපාලන කටයුතු, මෙහෙයුම් කළමනාකරණය හා සම්බන්ධීකරණය යථාවත්ව සිදු කිරීම අවශ්‍ය වේ. ඒ සඳහා පහත දක්වා ඇති කාර්ය හා කර්තව්‍යයන් ඉටු කරන ලදී.

❖ **අවම කාර්ය මණ්ඩලයක් පවත්වා ගැනීම**

වර්තමානයේ රටේ පවතින ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගනිමින් ගරු අග්‍රාමාත්‍යවරයා විසින් ලබාදී උපදෙස් පරිදි අවම කාර්ය මණ්ඩලයක් පමණක් පවත්වාගෙනයාම කෙරෙහි

අවධානය යොමු කරමින් පැවති සංවිධාන ව්‍යුහය සංශෝධනයට ලක් කිරීමට කටයුතු කරන ලදි. එමෙන්ම පෞද්ගලික/තාවකාලික කාර්ය මණ්ඩලයේ අනුමත තනතුරු අතරින් බඳවා ගැනීම් සිදුකර ඇත්තේ අත්‍යවශ්‍ය තනතුරු සඳහා පමණි.

❖ **සේවයේ ගුණාත්මකභාවය හා ඵලදායීතාව ඉහළ නැංවීම**

අග්‍රාමාත්‍ය කාර්යාලය සතු සම්පත් කාර්යක්ෂමතාවකින් හා සඵලතාවකින් යුතුව පරිහරණය මෙන්ම, අභ්‍යන්තර හා බාහිර සේවාලාභීන්ට කාර්යක්ෂම සේවාවක් ලබාදීම යන අරමුණු පෙරදැරි කරගෙන කාර්යාලයීය ඵලදායීතාව ඉහළ නැංවීමේ වැඩසටහන ක්‍රියාත්මක වේ. කාර්යාලයේ නිලධරයන් සඳහා ඵලදායීතා සංකල්පය පිළිබඳ මූලික සහතික පත්‍ර පාඨමාලාවක් කණ්ඩායම් 03ක් ඔස්සේ පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලදි. ඉන් පළමු කණ්ඩායම පාඨමාලාව නිම කරන ලද අතර, ඉතිරි කණ්ඩායම් 02 සඳහා පාඨමාලාව පවත්වා අවසන් කර ඇති අතර, ඇගයීම් පරීක්ෂණයේ ප්‍රතිඵල ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලය විසින් ඉදිරියේ දී නිකුත් කිරීමට කටයුතු කරනු ඇත. ඒ අනුව, අග්‍රාමාත්‍ය කාර්යාලයේ සමස්ත කාර්ය මණ්ඩලයට ම ඵලදායීතා සංකල්පය පිළිබඳව න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාදීමත්, එමඟින් සාමූහික ප්‍රවේශයක් ඔස්සේ නිර්මාණශීලීත්වයට ප්‍රමුඛතාව ලබාදීම මඟින් ඉදිරි වර්ෂයේ දී ඵලදායීතා සම්මාන තරඟාවලිය සඳහා ඉදිරිපත්වීමට අපේක්ෂා කරයි.

❖ **පෞද්ගලික ලිපිගොනු පිරික්සුම් ලේඛනය සැකසීම**

පෞද්ගලික ලිපිගොනුවල අඩංගු ලේඛන සඳහා පිරික්සුම් ලේඛනයක් මේ වන විට සකසා අවසන් කර ඇත. එමඟින් පෞද්ගලික ලිපිගොනුවල අන්තර්ගත විය යුතු ලේඛනවල පවතින අඩුපාඩු පහසුවෙන් හඳුනාගැනීමට හැකියාව ලැබී ඇති අතර, සම්පූර්ණ තොරතුරු ඇතුළත් පෞද්ගලික ලිපිගොනුව මඟින් නිලධරයාගේ වැටුප් වර්ධක හා උසස්වීම් ලබාදීම, විශ්‍රාම ගැන්වීමේ කටයුතු වැනි කාර්යයන්වල දී අවශ්‍ය තොරතුරු කාර්යක්ෂමව සොයා ගැනීමටත්, ප්‍රමාදයකින් තොරව අදාළ කාර්ය ඉටු කිරීමටත් හැකියාව ලැබී ඇත.

❖ **අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ භිමියන්ගේ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම**

රාජ්‍ය සේවකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය නඟා සිටුවීම සඳහා ස්ථාපිත ජාතික රක්ෂණ භාර

අරමුදල විසින් තම ප්‍රතිලාභ සැලසීමේ කටයුතු වඩාත් කාර්යක්ෂමව සහ විධිමත්ව පවත්වාගෙන යාමේ අරමුණින් ක්‍රියාත්මක කර ඇති දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේ වැඩසටහනට අනුව, අග්‍රාමාත්‍ය කාර්යාලයේ අග්‍රහාර රක්ෂණ හිමි සාමාජික සාමාජිකාවන් 237ගේ තොරතුරු මාර්ගගත ක්‍රමවේදයට අනුව යාවත්කාලීන කිරීමේ කටයුතු සිදු කර ඇත.

❖ **ප්‍රවාහන කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව පවත්වා ගැනීම**

ප්‍රවාහන අංශයේ ඉඩකඩ සීමිත වූ බැවින්, සුවදායී සේවා පරිසරයක් සඳහා සිරිමතිපාය පරිශ්‍රයේ ඇති සේවා ගොඩනැඟිල්ල වෙත ප්‍රවාහන අංශය ගෙන යන ලදී. කාර්ය මණ්ඩලය සහ රියදුරු මහතුන්ගේ දැනුම වර්ධනය කිරීමේ අරමුණෙන් යුතුව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනය සම්බන්ධ කර ගනිමින් සුරක්ෂිතව මාර්ගයේ ධාවනය කිරීම සහ රක්ෂණ ප්‍රතිලාභ ලබාගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේදය පිළිබඳව පුහුණුවක් රියදුරන්ට ලබාදෙන ලදි.

2.9 ඩිජිටල්කරණය හා නවීකරණය

පවතින ආර්ථික අර්බුදයට පිළියම් ලෙස රාජ්‍ය වියදම පාලනය කරමින් වඩාත් නවීන සේවාවන් සැපයීම හා ඩිජිටල් රාජ්‍ය සේවයක් ඇති කිරීමේ අභිමතාර්ථය පෙරදැරිව අග්‍රාමාත්‍ය කාර්යාලය තම කටයුතු සංවිධානය කරනු ලැබේ. ඒ අනුව, අග්‍රාමාත්‍ය කාර්යාලයේ කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා අභ්‍යන්තරව සකසන ලද මෘදුකාංග පද්ධති නිරන්තරයෙන් වැඩිදියුණු කිරීම සිදු කරනු ලබන අතර, රාජ්‍ය වියදම අඩු කර ගැනීම සඳහා තොරතුරු තාක්ෂණික භාවිතයන්ද අත්හදා බැලීම සිදු කරණු ලබයි. තවද, කාර්යක්ෂම සේවාවක් සැපයීම සහතික කරමින් අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිල වෙබ් අඩවිය නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම කරනු ලබන අතර, තොරතුරු සන්නිවේදන තාක්ෂණය යොදා ගනිමින් කාර්යාල කටයුතු පහසු කර ගැනීම සඳහා විවිධ වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලදී.

❖ **ලේඛන කළමනාකරණ පද්ධතිය හඳුන්වා දීම**

කාර්යාලයේ ලිපි හුවමාරු හා තැපැල් ඒකකයේ කටයුතු ලේඛන කළමනාකරණ පද්ධතිය (Document Management System) මඟින් සිදු කිරීමට පියවර ගෙන ඇත. තවද, මුද්‍රණ වියදම් අඩු කරගැනීම සඳහා කෙටුම්පත් (Draft) මෘදු පිටපත් ලෙස DMS හරහා යැවීම සහ

අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත යොමු කරනු ලබන ලිපි ලද බව දැනුම් දීම සඳහා කෙටි පණිවුඩ සේවාව (SMS) භාවිතය වැනි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික භාවිතයන් සාර්ථකව හඳුන්වා දී ඇත.

❖ **ලේඛනාගාරය සඳහා ලිපිගොනු කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම**

අභ්‍යන්තර සේවාලාභීන්ට කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබා දීම සඳහා පරිශීලන හිතකාමී ක්‍රමවේදයක් නිර්මාණය කිරීමේ අරමුණ පෙර දැරිව වාර්ෂිකව ලේඛනාගාරය සඳහා විවිධ අංශ මඟින් ලබා දෙනු ලබන ලිපිගොනු හා ලේඛන සුරක්ෂිතව ගබඩාකර තබා ගනිමින් නැවත කඩිනමින් අවශ්‍ය අවස්ථාවන්හී දී ලබා ගැනීමට අවශ්‍ය වන බැවින්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකයේ දායකත්වයෙන් අග්‍රාමාත්‍ය කාර්යාලයේ ලේඛනාගාරය සඳහා ලිපිගොනු කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කරන ලදී. තවද, එම ක්‍රමවේදය මඟින් ලිපි ගොනු බහා ඇති ස්ථානය කාර්යක්ෂමව හා නිවැරදිව හඳුනාගැනීමට ද පහසුකම් සලසා ඇත.

❖ **Whatsapp මෘදුකාංගය භාවිතය**

- කඩදාසි රහිත කාර්යාල ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමේ මූලික අඩිතාලමක් ලෙස සංචිත වාහන වෙන්කිරීම සඳහා මෙතෙක් පැවති ලිඛිත ඉල්ලීම වෙනුවට WhatsApp මඟින් පෝරමයක් හඳුන්වාදුන්වා දෙන ලදී. ඒ අනුව, ප්‍රවාහන සේවා අවශ්‍යතාව පිළිබඳ දැනුම් දීම සඳහා කෙටි පණිවුඩ සේවාව (SMS) යොදා ගැනීම ද කටයුතු යොදා ඇත.

- කාර්ය මණ්ඩලයේ නිවාඩු අනුමත කිරීමේ කටයුතු WhatsApp පෝරමයක් මඟින් සිදුකිරීම පිළිබඳ අධ්‍යනය කරමින් සිටින අතර, එහි ප්‍රගතිය මත සමස්ත කාර්යාලය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබයි.

❖ **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික ආපදා කළමනාකරණ අඩවියක් (Disaster Recovery Site) ස්ථාපිත කිරීම**

නවීන සයිබර් තර්ජනයන්ට මුහුණ දීමට හැකි වන පරිදි අග්‍රාමාත්‍ය කාර්යාලයේ සියලු දත්ත පද්ධති සඳහා සයිබර් ආරක්ෂණ විධි විධාන ක්‍රියාත්මක අතර, ඒවා නිරන්තර

අධීක්ෂණයට ලක් කෙරේ. නවීන සයිබර් ආරක්ෂණ විධි විධාන යටතේ අග්‍රාමාත්‍ය කාර්යාලය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික ආපදා කළමනාකරණ අඩවියක් (Disaster Recovery Site) ස්ථාපිත කිරීම සඳහා මූලික කටයුතු සම්පාදනය කරමින් පවතී.

2.10 විගණනය, කළමනාකරණය හා වාර්තාකරණය

අග්‍රාමාත්‍ය ලේකම්වරයා විසින් කරනු ලබන ඉල්ලීම් මත විගණන වාර්තා ලබා දීම, ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්තුමය ඇගයීම් වාර්තා ජාතික විගණන කාර්යාලය හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම හා එම ආයතනවල මාර්ගෝපදේශකත්වයට අනුකූලව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත කාලරාමු තුළ පැවැත්වීම සිදුවේ.

	රැස්වීම/ ඉටුකළ කාර්යය	දිනය	මූලසුන	ප්‍රතිඵල
1	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශන්ට අනුකූලව පළමු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීම	2022.03.09	අග්‍රාමාත්‍ය ලේකම්	පලමු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීම සහ රැස්වීම් වාර්තා අදාළ අංශ වෙත යොමු කිරීම
2	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශන්ට අනුකූලව දෙවන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීම	2022.09.02	අග්‍රාමාත්‍ය ලේකම්	දෙවන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීම හා රැස්වීම් වාර්තා අදාළ අංශ වෙත යොමු කිරීම

	රැස්වීම/ ඉටුකළ කාර්යය	දිනය	මූලසුන	ප්‍රතිඵල
3	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශන්ට අනුකූලව තුන්වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීම	2022.11.03	අග්‍රාමාත්‍ය ලේකම්	තුන්වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීම හා රැස්වීම් වාර්තා අදාළ අංශ වෙත යොමු කිරීම
4	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශන්ට අනුකූලව සිව්වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීම	2022.12.20	අග්‍රාමාත්‍ය ලේකම්	සිව්වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීම හා රැස්වීම් වාර්තා අදාළ අංශ වෙත යොමු කිරීම
5	ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ ඇගයීම් වාර්තාව කාර්තුමය වශයෙන් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම • 2021 සිව්වන කාර්තුව සඳහා ඇගයීම් වාර්තාව • 2022 පළමු කාර්තුව සඳහා ඇගයීම්වාර්තාව • 2022 දෙවන කාර්තුව සඳහා ඇගයීම් වාර්තාව • 2022 තුන්වන කාර්තුව සඳහා ඇගයීම් වාර්තාව	 2022.01.11 2022.04.27 2022.07.25 2022.10.31		
6	2009.06.09 දිනැති අංක : DMA/2009(1) දිනැති විගණන හා කළමනාකරණ චක්‍ර ලේඛයට අනුව කාර්තුමය වාර්තා ජාතික විගණන කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.	2022.02.25 2022.04.29 2022.08.10 2022.10.27		

	රැස්වීම/ ඉටුකළ කාර්යය	දිනය	මුලසුන	ප්‍රතිඵල
7	ජාතික විගණන කාර්යාලයට කාර්තුමය වශයෙන් අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කිරීම (ආකෘතිය 6) • පළමු කාර්තුව • දෙවන කාර්තුව • තුන්වන වන කාර්තුව	2022.03.14 2022.09.29 2022.11.10		
8	අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සහ විගණන නිරීක්ෂණ නිර්දේශ සහිතව අග්‍රාමාත්‍ය ලේකම් වෙත වාර්තා කිරීම.	2022.03.02 2022.04.29 2022.05.18 2022.06.17 2022.06.20 2022.07.06 2022.07.28 2022.08.29 2022.08.30 2022.10.13 2022.10.15 2022.10.18 2022.11.18 2022.12.05		එම විගණන නිරීක්ෂණ නිර්දේශ සහිතව අග්‍රාමාත්‍ය ලේකම් වෙත ඉදිරිපත් කර ඇත.
9	අග්‍රාමාත්‍ය ලේකම් විසින් ලබා දෙන උපදෙස් පරිදි විශේෂ විගණනයන් සිදු කිරීම	2022.03.02 2022.05.04 2022.06.20 2022.08.12		එම විගණන නිරීක්ෂණ නිර්දේශ සහිතව අග්‍රාමාත්‍ය ලේකම් වෙත ඉදිරිපත් කර ඇත.

2.11 රාජ්‍යතාන්ත්‍රික හා ජාත්‍යන්තර කටයුතු

ගරු අග්‍රාමාත්‍යවරයාගේ රාජ්‍යතාන්ත්‍රික හා කොන්සියුලර් කටයුතු සම්බන්ධීකරණය හා විවිධ ජාත්‍යන්තර වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය හා පහසුකම් සැපයීම අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් සිදු කරනු ලබයි.





2022.01.01. දින සිට 2022.12.31 දින දක්වා විදේශ ප්‍රභූවරුන්ගේ නිල ශ්‍රී ලංකා සංචාර, රාජ්‍යතාන්ත්‍රික හමුවීම්

#	මාසය	විදේශ ප්‍රභූවරුන්ගේ නිල ශ්‍රී ලංකා සංචාර	රාජ්‍යතාන්ත්‍රික හමුවීම් සංඛ්‍යාව
1	ජනවාරි	04	03
2	පෙබරවාරි	02	08
3	මාර්තු	05	02
4	අප්‍රේල්	00	00
5	මැයි	34	13
6	ජුනි		
7	ජූලි		
8	අගෝස්තු	05	06
9	සැප්තැම්බර්	07	6
10	ඔක්තෝබර්	03	02
11	නොවැම්බර්	10	07
12	දෙසැම්බර්	04	08





❖ **ගරු අග්‍රාමාත්‍යවරයාගේ මූලිකත්වයෙන් සිදු කළ විශේෂ ව්‍යාපෘති සහ වෙනත් ජාත්‍යන්තර ක්‍රියාකාරකම්**

- ලෝක ජනාවාස දින ජාතික උත්සවය අරලියගහ මන්දිරයේදී පැවැත්වීම
- පළාත් පාලනය සහ නායකත්වය පිළිබඳ පළමු ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශනය (ICLGL 2022) පැවැත්වීම
- එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO), කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) සහ එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන (WFP) එක්ව සංවිධානය කළ ලෝක ආහාර දිනයේ ප්‍රධාන දේශනය පැවැත්වීම
- ජපානය සහ ශ්‍රී ලංකාව අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතාවලට වසර 70ක් පිරීම නිමිත්තෙන් සමරු මුද්දරයක් නිකුත් කිරීම
- සැපයුම් සහ ද්‍රව්‍ය කළමනාකරණ ආයතනයේ (ISMM) 50 වැනි සංවත්සරය නිමිත්තෙන් කොළඹ පැවති ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ දේශනය පැවැත්වීම
- බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනයේ (BIDTI) 24 වැනි උපාධි ප්‍රධානෝත්සවයේ ප්‍රධාන දේශනය පැවැත්වීම
- ගෝලීය ජල හවුල්කාරිත්වය - දකුණු ආසියාව (GWP SAS) 28 වැනි ප්‍රාදේශීය සභා රැස්වීමේදී ප්‍රධාන දේශනය පැවැත්වීම
- ශ්‍රී ලංකාවේ KOICA සාමාජිකයින්ගේ සංගමය (AKOFE) විසින් සංවිධානය කරන ලද උත්සවයේ දේශනය පැවැත්වීම
- එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය විසින් සංවිධානය කරන ලද උත්සවයේ දේශනය පැවැත්වීම
- පොදුරාජ්‍ය මණ්ඩලීය වෙස් ශූරතා සම්මාන උළෙල සහ ත්‍යාග ප්‍රදානෝත්සවය අරලියගහ මන්දිරයේ දී පැවැත්වීම

- මහර්ෂි අරවින්ද් පදනම සහ ජනවාර්ගික විද්‍යා පදනම එක්ව සංවිධානය කරන ලද විශ්ව සංහිදියාව සඳහා සාමය ඇති කරන්නන්ගේ ජාත්‍යන්තර සම්මුතියේ දේශනය පැවැත්වීම
- හිටපු චීන ජනාධිපති ජියැං සෙමින් මහතාගේ අභාවය සම්බන්ධයෙන් ශෝකය ප්‍රකාශ කළ අතර චීන තානාපති කාර්යාලයේදී ශෝක ප්‍රකාශන පොතට අත්සන් තැබීම
- ඉන්දීය මහ කොමසාරිස් ගොපාල් බග්ලේ මහතා සමඟ ඉන්දියාවේ 75 වැනි නිදහස් දිනය සැමරීම සඳහා සීතාවක උද්භිද උද්‍යානයේ පැළයක් රෝපණය කිරීම
- ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් භග්ලේ සමඟ ශ්‍රී ලංකා තාක්ෂණ මණ්ඩපය (SLTC) පර්යේෂණ විශ්ව විද්‍යාලය (SLTC) සහ මදුරාසියේ ඉන්දියානු තාක්ෂණ ආයතනය (IITM) අතර අධ්‍යයන, පර්යේෂණ සහ ඇතුළත් හවුල්කාරිත්වය සඳහා හවුල්කාරිත්ව සම්බන්ධතාවයක් ස්ථාපිත කිරීම හා සම්පත් හුවමාරුව වැඩසටහනට සහභාගී වීම



2.12 මහජන පැමිණිලි හා දුක් ගැනවිලි සඳහා සහන සැලසීම

ගරු අග්‍රාමාත්‍යවරයා වෙත යොමු වන මහජන ඉල්ලීම් හා දුක්ගැනවිලි ඉතා කාර්යක්ෂමව හා ඵලදායීව කළමනාකරණය කිරීම අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් සිදු කරනු ලබයි. ඒ යටතේ පහත සඳහන් පරිදි කටයුතු සිදු කරනු ලැබේ.

- මහජන ඉල්ලීම් හා දුක්ගැනවිලි කඩිනමින් ඉටුකරදීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම

- මහජන ඉල්ලීම් සහ අවශ්‍යතාවයන් ඉටු කිරීම පිළිබඳ ප්‍රගතිය සොයා බැලීම

- මහජනතාවගේ ව්‍යවස්ථානුකූල අයිතීන් බලගැන්වීම සඳහා සම්බන්ධීකරණය

- මහජන සම්බන්ධතා අංශය වෙත ලැබෙන තොරතුරු හා යෝජනා ප්‍රතිපත්ති සම්පාදනය කරනු ලබන ආයතන වෙත ඉදිරිපත් කිරීම

- මහජන ගැටලු විසඳීම සඳහා රාජ්‍ය ආයතන සමඟ ශක්තිමත් සම්බන්ධීකරණයක් ගොඩනැගීම

- දත්ත කළමනාකරණ පද්ධතිය හරහා මහජන සම්බන්ධතා අංශය වෙත ලැබෙන ඉල්ලීම් වඩාත් කාර්යක්ෂමව හා කඩිනම්ව අදාළ අංශ වෙත යොමු කිරීම, එම කාර්යය නිසි පරිදි කළමනාකරණය හා අධීක්ෂණය කිරීම සිදු කිරීම හා අදාළ දත්ත විශ්ලේෂණය කර වාර්තා සැකසීම

❖ **2022 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා මහජන ඉල්ලීම් හා පැමිණිලි ඉදිරිපත් වී ඇති ආකාරය**

ගරු අග්‍රාමාත්‍යවරයා වෙත ලියාපදිංචි තැපෑල මඟින් යොමුකර ඇති මහජන ගැටලු, දුක්ගැනවිලි හා ඉල්ලීම් සංඛ්‍යාව	9,713
සාමාන්‍ය තැපෑල මඟින් යොමුකරන ලද මහජන ගැටලු, දුක්ගැනවිලි හා ඉල්ලීම් සංඛ්‍යාව	7,405
පැමිණ භාරදෙන මහජන ගැටලු, දුක්ගැනවිලි හා ඉල්ලීම් සංඛ්‍යාව	2,526
විද්‍යුත් තැපෑල මඟින් යොමුකරන ලද මහජන ගැටලු, දුක්ගැනවිලි හා ඉල්ලීම් සංඛ්‍යාව	1,168
ෆැක්ස් මඟින් යොමුකරන ලද මහජන ගැටලු, දුක්ගැනවිලි හා ඉල්ලීම් සංඛ්‍යාව	435
පිලිතුරු ලිපි	4,451



❖ **2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා කාල සීමාව තුල ඉටුකරන ලද කාර්යයන්**

- මහජන ඉල්ලීම් හා දුක්ගැනවිලි වඩාත් කාර්යක්ෂමව හා කඩිනම්ව අදාළ ආයතන වෙත යොමු කිරීමටත්, එම කාර්යය නිසි පරිදි කළමනාකරණය හා අධීක්ෂණය කිරීම සඳහාත් දත්ත කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කර ඇත.

- ගරු අග්‍රාමාත්‍යතුමා වෙත ඉදිරිපත් කරනු ලබන මහජන දුක්ගැනවිලි හා පැමිණිලි මහජන සම්බන්ධතා අංශයට ලද විට, එය ලද බවට කාර්යාලයීය යොමු අංකය ද සමඟින් කෙටි පණිවිඩයක් මඟින් දුක්ගැනවිල්ල හෝ පැමිණිල්ල ඉදිරිපත් කරන ලද තැනැත්තා වෙත සන්නිවේදනය කිරීමට කටයුතු කිරීම.



- මහජන ඉල්ලීම් හා දුක්ගැනවිලි කඩිනමින් ඉටුකර දීම සඳහා සියලු අමාත්‍යාංශ නියෝජනය වන පරිදි මාණ්ඩලික මට්ටමේ සම්බන්ධීකරණ නිලධාරියෙකු පත්කර ගැටලු කඩිනමින් විසඳීමේ යාන්ත්‍රණයක් ආරම්භ කිරීම.

- සියලුම ලිපි ලේඛන පරිලෝකනය කිරීම, ඉදිරි නෛතික හා වෙනත් අවශ්‍යතා සඳහා මෘදු පිටපත් වශයෙන් ගබඩා කර තබා ගැනීම.

- මහජන ඉල්ලීම් හා දුක් ගැනවිලි සම්බන්ධයෙන් අවසන් විසඳුමක් ලබා ගැනීම දක්වා වූ පසු විපරම් ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම.

2.13 මාධ්‍ය හා සන්නිවේදනය

ගරු අග්‍රාමාත්‍යවරයා, අග්‍රාමාත්‍ය කාර්යාලය සහ ගරු අග්‍රාමාත්‍යවරයා යටතේ පවතින අමාත්‍යාංශ මඟින් සිදුකරනු ලබන සංවර්ධන හා සමාජයීය කාර්යයන් පිළිබඳව දැනුවත් කිරීම සඳහා විධිමත්, ක්‍රමවත් සහ බලාත්මක මාධ්‍ය භාවිතයක් සිදු කිරීම අවශ්‍ය වන අතර, ඒ හා අදාළව සිදුකරන ලද අතීත හා වර්තමාන මෙහෙවර අනාගතය වෙනුවෙන් සංරක්ෂණය කිරීම ද අවශ්‍ය කාර්යයක් වේ.

2022 වර්ෂයේ මාධ්‍ය හා සන්නිවේදන විෂය ක්ෂේත්‍රයට අදාළව සිදු කරන ලද කටයුතු

- ජාතික උත්සව, සම්මන්ත්‍රණ, වැඩමුළු හා විශේෂ අවස්ථා සංවිධානය, මාධ්‍ය සම්බන්ධීකරණය, මාධ්‍ය ආවරණය, ඊට අදාළ ප්‍රවෘත්ති, ප්‍රවෘත්ති විශේෂාංග, ලිපි, ප්‍රවෘත්ති නිවේදන, වාර්තා වැඩසටහන්, ඡායාරූප සහ වීඩියෝ දර්ශන රූපවාහිනී නාලිකා, ගුවන් විදුලි නාලිකා, පුවත්පත්, විදේශ මාධ්‍ය, නව මාධ්‍ය හා අග්‍රාමාත්‍ය කාර්යාලයේ වෙබ් අඩවියේ පළකිරීම සඳහා නිකුත් කිරීම හා පසු විපරම් සිදු කිරීම

- මාධ්‍ය ආයතනවලට අවශ්‍ය අමතර මූලාශ්‍ර හා තොරතුරු සැපයීම

- ගරු අග්‍රාමාත්‍යවරයාගේ මැදිහත්වීම මත දිවයින පුරා ක්‍රියාත්මක ජාතික ආහාර සුරක්ෂිතතා ජාතික වැඩසටහන සහ ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන වැඩසටහන් සඳහා අවශ්‍ය තොරතුරු රැස්කිරීම හා මාධ්‍ය සම්බන්ධීකරණය

- ගරු අග්‍රාමාත්‍යවරයාගේ පාර්ලිමේන්තු කටයුතු සඳහා මාධ්‍ය සම්බන්ධීකරණය සිදු කිරීම

- ගරු අග්‍රාමාත්‍යවරයා සහභාගී වන රැස්වීම් හා විවිධ උත්සව සඳහා සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් දේශන සහ කතා සඳහා කරුණු සැකසීම

- වෙනත් සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් තොරතුරු රැස්කිරීම

- අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ආර්ථික, සමාජයීය හා සංවර්ධන කටයුතු සම්බන්ධව මාධ්‍ය මඟින් ජනතාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම

- වෙනත් ජාතික හා සමාජයීය වශයෙන් වැදගත් වන කරුණු සම්බන්ධයෙන් අධ්‍යයනයන් සිදු කිරීම හා ඒ සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යවරයා දැනුවත් කිරීම

- රාජ්‍ය හා පුද්ගලික ආයතන විසින් අරලියගහ මන්දිර පරිශ්‍රය තුළ පවත්වනු ලබන විවිධ වැඩසටහන් හා උත්සව සංවිධානය සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීම

- ප්‍රවෘත්ති, ඡායාරූප හා වීඩියෝ සංරක්ෂණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම

- පොහොය දින ධර්ම දේශනා වැඩසටහන සහ විවිධ ආගමික උත්සව සංවිධානය කිරීම

- ගරු අග්‍රාමාත්‍යවරයා වෙනුවෙන් ආගමික, සමාජයීය හා සංස්කෘතික විෂයන් සම්බන්ධයෙන් සුභපැතුම් පණිවිඩ, ශෝක පණිවිඩ නිකුත් කිරීම

- සමරු කලාප සහ විශේෂ දින සැමරුම් වෙනුවෙන් ගරු අග්‍රාමාත්‍යවරයාගේ විශේෂ පණිවිඩ නිකුත් කිරීම

- ආගමික විෂය සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යවරයා වෙත යොමු කරන ලද සමාජයීය හා සංස්කෘතික ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම

❖ **මාධ්‍ය හා සන්නිවේදන ක්‍රියාකාරීත්වය**



2.14 ආගමික කටයුතු සඳහා මැදිහත්වීම

ගරු අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් ජාතික මට්ටමින් සංවිධානය කෙරෙන ආගමික වැඩසටහන් සහ ආගමික උත්සව පිළිබඳවත්, ආගමික කටයුතු සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යවරයා වෙත යොමු කරන ලද ඉල්ලීම් පිළිබඳවත්, ආගමික විෂය සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන ශුභාශිංසන සහ ශෝක පණිවිඩ පිළිබඳවත්, අරලියගහ මන්දිර පරිශ්‍රය තුල විවිධ උත්සව සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම සහ දායකත්වය ලබා දීමත් අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් සිදු කරනු ලබයි.

❖ **ධර්මදීපනී පොහෝ දින ධර්ම දේශනා වැඩසටහන**

ප්‍රඥාසම්පන්න දැහැමි ජන සමාජයක් උදෙසා බුදු දහමේ සිසිලස බෙදාදීමේ අරමුණ පෙරදැරිව පොහොය දින ධර්මදේශනා පුණ්‍ය කර්මය 2022.01.01. දින සිට 2022.12.31 දින දක්වා කාලය තුළ සෑම මසකම පොහොය දිනයේ පැවැත්වීමට කටයුතු යොදන ලදී. ධර්මදීපනී පොහොය දින ධර්ම දේශනා වැඩසටහන් මාලාව වර්තමාන අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාන්ගේ උපදෙස් හා මහපෙන්වීම අනුව සිදු කරන ලදී.



❖ **ආගමික කටයුතු සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා වෙත යොමු කරන ලද ඉල්ලීම් සම්බන්ධ කටයුතු සිදු කිරීම**

ගරු අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් ජාතික මට්ටමින් සංවිධානය කෙරෙන ආගමික වැඩසටහන් සහ ආගමික උත්සව පිළිබඳව ද ආගමික කටයුතු සම්බන්ධයෙන් ගෞරවනීය ස්වාමීන්වහන්සේලා හා වෙනත් ආගමික නායකයන් හා විවිධ පාර්ශව විසින් ගරු අග්‍රාමාත්‍යවරයා වෙත දෛනිකව යොමු කරන ලද ඉල්ලීම් සම්බන්ධයෙන් ද සම්බන්ධීකරණය හා ඊට අදාල පසුවිපරම් කටයුතු අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් සිදු කරනු ලබයි.

❖ **විශේෂ ආගමික, වෙනත් සමාජ හා සංස්කෘතික වැඩසටහන් සංවිධානය කිරීම හා පහසුකම් සැපයීම**

ගරු අග්‍රාමාත්‍යවරයාගේ සහභාගීත්වයෙන් හා ප්‍රධානත්වයෙන් ජාතික මට්ටමින් සංවිධානය කරනු ලබන විශේෂ ආගමික වැඩසටහන් සංවිධානය කිරීමත් ඒ සඳහා පහසුකම් සැපයීමත්, අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් සිදු කරන ලදී. ඒ අනුව කොළඹ ගංගාරාම විහාරස්ථානයේ 43 වන නවම් මහා පෙරහැර 2022 පෙබරවාරි 15 – 16 යන දිනයන් හි වීදි සංචාරය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසාදීම හා සම්බන්ධීකරණය සිදු කිරීමත්, 2022 වර්ෂයේ වෙසක් පොහොය නිමිත්තකොට මැයි මස 15 – 17 යන දිනයන්හි හා පොසොන් මස 14 – 16 යන දිනයන් හිදී ගංගාරාම විහාරස්ථානය ආශ්‍රිත දන්සැල සඳහා පහසුකම් සැපයීමත්, අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් සිදු කරනු ලැබ ඇත.



තවද, රාජ්‍ය හා පුද්ගලික ආයතන විසින් අරලියගහ මන්දිර පරිශ්‍රය තුළ පවත්වනු ලබන විවිධ වැඩසටහන් හා උත්සව සංවිධානය සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීම ද සිදු කරනු ලබන අතර, 2022 වර්ෂය තුළ එවැනි උත්සව 08 ක් පැවැත්වීමට කටයුතු යොදා ඇත.



❖ **ශුභාශිංසන පණිවිඩ හා ශෝක පණිවිඩ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම**

ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශයන්හි රාජ්‍ය නායකයින් පැමිණීමේදී හා ජාතික දිනයන් ආශ්‍රිතව සිදු කරන විවිධ උත්සව සනිටුහන් කරමින් ශුභාශිංසන පණිවිඩ හා සමරු කළඹ නිකුත් කරනු ලබන අවස්ථාවන්හි දී, ඒ සඳහා ගරු අග්‍රාමාත්‍යවරයාගේ ශුභාශිංසන පණිවිඩ නිකුත් කරනු ලබන අතර, ගෞරවනීය ස්වාමීන්වහන්සේලා විෂයෙහි, නායක පදවි අක්ත පත්‍ර ප්‍රදානය කිරීම, විහාරස්ථාන සංවත්සර උත්සව වැනි විශේෂ අවස්ථා පදනම් කර ගනිමින්, ගරු අග්‍රාමාත්‍යවරයා වෙත යොමු කරනු ලබන ඉල්ලීම් අනුව සුභාශිංසන පණිවුඩ නිකුත් කිරීම සහ මීට අමතරව ජාතික හා ශාසනික මෙහෙවරක නිරත යතිවරයාණන් වහන්සේලා සහ අනෙකුත් ආගමික නායක පූජකතුමන්ලාගේ ජන්ම දින නිමිති කරගනිමින් හා විශේෂ දින නිමිති කරගනිමින් ද ශුභාශිංසන පණිවිඩ නිකුත් කිරීම ද අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් සිදු කරනු ලබයි.

මෙරට මෙන්ම විදේශයන් හි වැඩසටහන ගෞරවාර්හ මහානායක, අනුනායක ස්වාමීන් වහන්සේලා, විහාරාධිපති හා අනෙකුත් ස්වාමීන් වහන්සේලා අපවත් වූ අවස්ථාවල ඒ සඳහා අග්‍රාමාත්‍යවරයාගේ සංවේගය පළ කිරීම සඳහා එතුමාගේ අත්සනින් ශෝක පණිවිඩ නිකුත් කරනු ලැබේ. ඒ අනුව 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා ආගමික විෂයට අදාළව ශුභාශිංසන හා ශෝක පණිවිඩ (දේශීය හා විදේශීය) 58ක් නිකුත් කර ඇත.

❖ **සංකථන මණ්ඩපය**

අග්‍රාමාත්‍යවරයාගේ සංකල්පයක් අනුව ඇරඹී සංකථන මණ්ඩපය හරහා ඓතිහාසික, කාලීන යම් යම් මාතෘකා ඔස්සේ සමාජය තුල සංවාදයක් ඇරඹීම අදහස් කෙරේ. ඒ ඒ ක්ෂේත්‍රවල ප්‍රවීනයින්, මාධ්‍යවේදීන් මෙන්ම විශ්ව විද්‍යාල හා පාසල් සිසුන් සම්බන්ධ කරගනිමින් පැවැත්වෙන මෙම සංකථන මණ්ඩපය මඟින් තාර්කික දැනුමින් සන්නද්ධ අනාගත පරපුරක් බිහිකිරීම අපේක්ෂා කෙරේ. එහි පළමු වැඩසටහන 2023 වර්ෂයේ මුල් කාර්තුවේ පැවැත්වීමට නියමිතය.

අනුර දිසානායක
අග්‍රාමාත්‍ය ලේකම්
(ආයතනික වගවීම)

ඇන්ටන් පෙරේරා
අතිරේක ලේකම් (සංවර්ධන I)
(අධික්ෂණය හා නියාමනය)

ඒ ටී ඒකනායක
අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)
(සැකැස්ම හා සංස්කරණය)

3.0 වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසිඒ-එන්

අග්‍රාමාත්‍ය කාර්යාලය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	කළ්‍ය 2022 රු.	2021 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		1,073,760,000	1,609,800,000	ඒසිඒ-3
-	නැන්පතු		27,497,161	9,528,160	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		39,393,852	22,307,813	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**1,140,651,013**	1,641,635,973	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**1,140,651,013**	1,641,635,973	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**1,140,651,013**	1,641,635,973	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
394,485,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	340,306,482	443,471,743	
812,365,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	739,432,671	796,361,272	ඒසිඒ-2(ii)
2,600,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	2,393,789	2,311,965	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
1,209,450,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**1,082,132,942**	1,242,144,980	
	මූලධන වියදම්				
209,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	206,335,279	334,623,707	
23,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	21,653,314	84,028,905	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
800,000	හැකියා වර්ධනය	14	325,518	923,732	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
233,300,000	මුළු මූලධන වියදම් (උ)		**228,314,111**	419,576,344	
	නැන්පතු ගෙවීම්		5,111,030	35,666,688	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		31,179,937	30,715,005	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**36,290,966**	66,381,693	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		1,346,738,020	1,728,103,017	
1,442,750,000	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		**(206,087,006)**	(86,467,044)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(206,087,006)	(86,467,044)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිඒ-3
			(206,087,006)	(86,467,044)	

1

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒඑසී-පී

අග්‍රාමාත්‍ය කාර්යාලය
2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒඑසී-6	20,084,385,017	19,983,883,399
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒඑසී-5/5(ඒ)	51,419,565	59,633,480
මුදල් හා මුදල් සමාන දෑ	ඒඑසී-3	-	-
මුළු වත්කම්		**20,135,804,582**	**20,043,516,880**
ශුද්ධ වත්කම් / ස්වාමිත්වය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		23,344,160	53,944,207
දේපළ පිරියත හා උපකරණ සංචිතය		20,084,385,017	19,983,883,399
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒඑසී-5(බී)		
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒඑසී-4	28,075,405	5,689,274
අග්‍රිම ශේෂය	ඒඑසී-3	-	-
මුළු වගකීම්		**20,135,804,582**	**20,043,516,880**

පිටු අංක 7 සිට 24 දක්වා ඒඑසී 2 සිට ඒඑසී 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් නොරකුරු සහ ඇමුණුම් පිටු අංක 25 සිට 31 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් නොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අයිතෘණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 23/02/2023

අනුර දිසානායක
අග්‍රාමාත්‍ය ලේකම්
අග්‍රාමාත්‍ය කාර්යාලය
58, ශ්‍රීමත් ආර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 07.

.....
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 23/02/2023

වසි.වම්.වස්. ගුණසේකර
ප්‍රධාන මූල්‍ය නිලධාරි
අග්‍රාමාත්‍ය කාර්යාලය
58, ශ්‍රීමත් ආර්නස්ට් ද සිල්වා මාවත
කොළඹ 07

.....
ප්‍රධාන ගණකාධිකාරි
නම :
දිනය : 23/02/2023

එම්.එම්.පේ.ආර්.එන්. ප්‍රනාන්දු
ප්‍රධාන ගණකාධිකාරි
අග්‍රාමාත්‍ය කාර්යාලය
58, ශ්‍රීමත් ආර්නස්ට් ද සිල්වා මාවත
කොළඹ 07

2

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසිඒ-සී

අග්‍රාමාත්‍ය කාර්යාලය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	211,952,564	41,317,445
අග්‍රිම ලැබීම්	1,073,760,000	1,609,800,000
අත්තිකාරම් අයකර ගැනීම්	19,654,772	27,486,819
නැන්පතු ලැබීම්	27,497,161	9,528,160
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,332,864,497**	**1,688,132,424**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,066,512,509	1,195,481,432
සහනාධාර සහ මාරුකිරීම්	2,393,789	2,311,965
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	3,955,567	5,689,345
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	26,577,492	29,406,652
නැන්පතු ගෙවීම්	5,111,030	35,666,688
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,104,550,386**	**1,268,556,081**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**228,314,111**	**419,576,344**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	228,314,111	419,576,344
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**228,314,111**	**419,576,344**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඈ)-(ඉ)	**(228,314,111)**	**(419,576,344)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඌ)=(ඇ) + (උ)	**(0)**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඵ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඵ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

4.0 ආයතනයේ කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම අනුව)

ප්‍රධාන ක්ෂේත්‍රය	ක්‍රියාකාරකම	දර්ශකය	සත්‍ය නිමැවුම ප්‍රතිශතයක් ලෙස (%)		
			100%-90%	89% - 75%	74% - 50%
ජාතික ප්‍රතිපත්ති සම්පාදනය, ඒවා ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම් කිරීම	විවිධ රාජ්‍ය ආයතන/ දේශපාලන අධිකාරීන් විසින් ගරු අග්‍රාමාත්‍යවරයා වෙත යොමු කරන ලද විශේෂ ඉල්ලීම්වලට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම	මැදිහත්ව ක්‍රියාකරන ලද විශේෂ ඉල්ලීම් සංඛ්‍යාව	✓		
	ගරු අග්‍රාමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ, අමාත්‍ය මණ්ඩල සටහන් පිළියෙල කිරීම, ඒවා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම, වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සහ පාර්ලිමේන්තු ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම	ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ හා සටහන් සංඛ්‍යාව සභාගත කරන ලද වර්තා සහ පිළිතුරු සපයන ලද පාර්ලිමේන්තු ප්‍රශ්න සංඛ්‍යාව	✓		
	ගරු අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලබන රැස්වීම්/විශේෂ උත්සව සහ අවස්ථා සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය හා පහසුකම් සැපයීම	පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව/ යවන ලද කෙටුම්පත් සංඛ්‍යාව	✓		
	ගරු අග්‍රාමාත්‍යවරයා/ අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීම්වලදී ගනු ලැබූ තීරණ පසුවිපරම් කිරීම	පසු විපරම් කරන ලද තීරණ සංඛ්‍යාව	✓		

ප්‍රධාන ක්ෂේත්‍රය	ක්‍රියාකාරකම	දර්ශකය	සත්‍ය නිමැවුම ප්‍රතිශතයක් ලෙස (%)		
			100%-90%	89% - 75%	74% - 50%
ජාතික ප්‍රතිපත්ති සම්පාදනය, ඒවා ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම් කිරීම	අන්තර් අමාත්‍යාංශ/ නියෝජිත ආයතනවල සංවර්ධන කාර්යයන් සඳහා පහසුකම් සැලසීම	ඉටු කරන ලද ක්‍රියාකාරකම් සංඛ්‍යාව	✓		
	කාලීනව පැන නගින ජාතික අවශ්‍යතාවන් හා ගැටලු හඳුනාගෙන, ඒ අනුව අධ්‍යයන වාර්තා සකස් කිරීම	හඳුනාගත් ගැටලු හා සකස් කළ වාර්තා සංඛ්‍යාව	✓		
	මහජන දුක්ගැනවිලි සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේදී හඳුනාගන්නා ලද ජාතික ප්‍රතිපත්තිවල පවතින ප්‍රායෝගික ගැටලු නිවැරදි කිරීම	නිවැරදි කළ ගැටළු සංඛ්‍යාව		✓	
ආගමික කටයුතු සහ සමාජ සුබසාධනය	ජාතික / ආගමික උත්සව සහ සමාජ සත්කාරක සේවාවන්ට අදාළ කටයුතු සම්බන්ධීකරණය	සම්බන්ධීකරණය කරන ලද ජාතික / ආගමික උත්සව සහ සමාජ සත්කාරක සේවාවන් සංඛ්‍යාව	✓		
	මාසික පොහොය දින ධර්ම දේශනා වැඩ සටහන පැවැත්වීම	පවත්වන ලද ධර්ම දේශනා සංඛ්‍යාව	✓		
	ආගමික කටයුතු සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන සාකච්ඡා සම්බන්ධීකරණය	ඉටු කරන ලද ක්‍රියාකාරකම් සංඛ්‍යාව	✓		
	ආගමික විෂය සම්බන්ධයෙන් ශුභාශිංෂන පණිවිඩ නිකුත් කිරීම හා සම්බන්ධ කටයුතු	සකස් කරන ලද සුභපැතුම් සංඛ්‍යාව	✓		
	ආගමික විෂය සම්බන්ධයෙන් ශෝක පණිවිඩ නිකුත් කිරීම හා සම්බන්ධ කටයුතු	සකස් කරන ලද ශෝක පණිවිඩ සංඛ්‍යාව	✓		

ප්‍රධාන ක්ෂේත්‍රය	ක්‍රියාකාරකම	දර්ශකය	සත්‍ය නිමැවුම ප්‍රතිශතයක් ලෙස (%)		
			100% - 90%	89% - 75%	74% - 50%
ආගමික කටයුතු සහ සමාජ සුබසාධනය	විශේෂ ආගමික වැඩසටහන් උත්සව සංවිධානය කිරීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	✓		
	සෞඛ්‍ය, අධ්‍යාපන, අපද්‍රව්‍ය කළමනාකරණය, සමාජ සුභ සාධනය, පාරිසරික, යටිතල පහසුකම් හා රාජ්‍ය පරිපාලනය වැනි විෂයන්ට අදාලව මහජනතාවගේ නොවිසඳුණු ගැටළු හඳුනාගැනීම	යවන ලද ලිපි සංඛ්‍යාව සහ ඉල්ලීම් සංඛ්‍යාව		✓	
	පොදු ගැටලු සහ දුක්ගැනවිලි විසඳීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය	යවන ලද ලිපි සංඛ්‍යාව/ ප්‍රතිචාර දැක්වූ ලිපි සංඛ්‍යාව	✓		
	රාජ්‍ය සේවයේ ගුණාත්මක භාවය සහ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා රේඛීය අමාත්‍යාංශ සහ අනෙකුත් රාජ්‍ය ආයතන වෙත නව යෝජනා ඉදිරිපත් කිරීම	යවන ලද ලිපි සංඛ්‍යාව/ ප්‍රතිචාර දැක්වූ ලිපි සංඛ්‍යාව	✓		
ජාත්‍යන්තර සහයෝගීතාවය	විදේශීය දූත මණ්ඩල හා විදේශීය තානාපති සේවයේ නිලධාරීන් සමඟ සම්බන්ධතා වැඩිදියුණු කිරීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය	ඉටු කරන ලද ක්‍රියාකාරකම් සංඛ්‍යාව	✓		
	ජාත්‍යන්තර සමුළු සඳහා ගරු අග්‍රාමාත්‍යතුමාගේ සහභාගිත්වයට අදාළ කටයුතු සම්බන්ධීකරණය	ඉටු කරන ලද ක්‍රියාකරකම් සංඛ්‍යාව	✓		
නීතිමය කටයුතු	නීති කෙටුම්පත් සංශෝධන, සමාලෝචනය සහ අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම	නීති කෙටුම්පත් සංශෝධන සම්බන්ධයෙන් ඉදිරිපත් කළ සමාලෝචන හා නිර්දේශ වාර්තා සංඛ්‍යාව	✓		

ප්‍රධාන ක්ෂේත්‍රය	ක්‍රියාකාරකම	දර්ශකය	සත්‍ය නිමැවුම ප්‍රතිශතයක් ලෙස (%)		
			100%-90%	89% - 75%	74% - 50%
නීතිමය කටයුතු	අධිකරණ නඩුවලට අදාළව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කිරීම	නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කරන ලද නඩු සංඛ්‍යාව	✓		
	නීතිය සහ අධිකරණ ක්‍රියාවලිය පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා මර්ග ගත ක්‍රමය ඔස්සේ වැඩසටහන් සංවිධානය කිරීම සහ දිස්ත්‍රික්ක මට්ටමින් සම්මන්ත්‍රණ මාලාවක් සංවිධානය කිරීම	වැඩසටහන් සහ සම්මන්ත්‍රණ සංඛ්‍යාව			✓
	නීතිය සහ අධිකරණ ක්‍රියාවලිය පිළිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීම	වැඩසටහන් සංඛ්‍යාව			✓
	නීති සඟරාව 2022, වෙළුම I, II, III, සහ IV අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් ප්‍රකාශනය කිරීම	නියමිති දිනට සඟරාව ප්‍රකාශයට පත් කිරීම			✓
මහජන අදහස් සහ තොරතුරු සන්නිවේදනය හා ප්‍රචාරණය	රාජ්‍ය/ ජාතික උත්සව හා විශේෂ උත්සව අවස්ථාවන් සඳහා මාධ්‍ය ආවරණය සැපයීමට පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය	මාධ්‍ය ආවරණය කරන ලද ජාතික/රාජ්‍ය හා විශේෂ උත්සව/අවස්ථා සංඛ්‍යාව	✓		
විධිමත් හා යහපත් ආයතනික ක්‍රියාකාරකම්	2021 වර්ෂය සඳහා විසර්ජන ගිණුම සකස් කිරීම	2021 විසර්ජන ගිණුම නියමිත දිනයේදී ඉදිරිපත් කිරීම	✓		

ප්‍රධාන ක්ෂේත්‍රය	ක්‍රියාකාරකම	දර්ශකය	සත්‍ය නිමැවුම ප්‍රතිශතයක් ලෙස (%)		
			100%-90%	89% - 75%	74% - 50%
විධිමත් හා යහපත් ආයතනික ක්‍රියාකාරකම්	2023 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කර භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම	2023 අයවැය ඇස්තමේන්තුව නියමිත දිනයේදි ඉදිරිපත් කිරීම	✓		
	විගණන කාර්යාලයෙන් සහ අභ්‍යන්තර විගණකගෙන් ලද විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම	පිළිතුරු සපයන ලද විගණන විමසුම් සංඛ්‍යාව	✓		
	2021 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලසුම සකස් කිරීම	2021 අභ්‍යන්තර විගණන සැලසුම නියමිත දිනට ඉදිරිපත් කිරීම	✓		
	2021 වර්ෂයේ කාර්යසාධන වාර්තාව සකස් කිරීම	2020 කාර්යසාධන වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කිරීම	✓		
	2022 වර්ෂය සඳහා කාර්තුමය සහ වාර්ෂික භෞතික හා මූල්‍ය ප්‍රගති වාර්තාව සකස් කිරීම	2022 වර්ෂයේ කාර්තුමය හා වාර්ෂික ප්‍රගති වාර්තාව නියමිත දිනයේදි ඉදිරිපත් කිරීම	✓		
	2023 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	2023 ක්‍රියාකාරී සැලැස්ම නියමිත දිනයේදි ඉදිරිපත් කිරීම	✓		
	මහජන පැමිණිලි හා දුක්ගැනවිලි කඩිනමින් හා විධිමත්ව ලබා ගැනීම සඳහා වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම	දත්ත කළමනාකරණ පද්ධතිය සඳහා ඇතුලත් කරන ලද ලිපි/ වාර්තා සංඛ්‍යාව එමඟින් සකස් කරන ලද වාර්තා සංඛ්‍යාව උපදේශන සංඛ්‍යාව	✓		
	විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම	පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සංඛ්‍යාව		✓	

ප්‍රධාන ක්ෂේත්‍රය	ක්‍රියාකාරකම	දර්ශකය	සත්‍ය නිමැවුම ප්‍රතිශතයක් ලෙස (%)		
			100%-90%	89% - 75%	74% - 50%
විධිමත් හා යහපත් ආයතනික ක්‍රියාකාරකම්	අභ්‍යන්තර විගණන වාර්තා සකස් කිරීම	සකස් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා සංඛ්‍යාව	✓		
	2023 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලසුම සකස් කිරීම	2023 අභ්‍යන්තර විගණන සැලසුම නියමිත දිනට ඉදිරිපත් කිරීම	✓		
ධාරිතා සංවර්ධනය	නිලධාරීන්ගේ දේශීය හා විදේශීය පුහුණුවීම් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය	අවසන් කළ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සංඛ්‍යාව/ සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව	✓		
	ඵලදායීතාව ඉහළ නැංවීම (සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම)	ඉටු කරන ලද ක්‍රියාකාරකම් සංඛ්‍යාව		✓	
ඩිජිටල්කරණය	වෙබ් අඩවිය හා සම්බන්ධ දත්ත කළමනාකරණ පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහ නව යෙදවුම් සැපයීම	ඉටු කරන ලද ක්‍රියාකාරකම් සංඛ්‍යාව	✓		
	කාර්යාලයීය වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වා ගැනීම	යාවත්කාලීන කරන ලද කාර්යාලයීය වෙබ් අඩවිය	✓		
	පරිගණක ජාල, ඊමේල් සහ පරිගණක යෙදවුම් සේවා නඩත්තුව	භාවිතා කරන්නන්හට පහසු සහ ආරක්ෂිත සේවාවක් සැපයීම	✓		
	අභ්‍යන්තර තොරතුරු පද්ධතිය නඩත්තුව හා සංවර්ධනය	යාවත්කාලීන කරන ලද අභ්‍යන්තර තොරතුරු පද්ධතිය	✓		

ප්‍රධාන ක්ෂේත්‍රය	ක්‍රියාකාරකම	දර්ශකය	සත්‍ය නිමැවුම ප්‍රතිශතයක් ලෙස (%)		
			100%-90%	89% - 75%	74% - 50%
ආයතනික කළමනාකරණය සහ සංවර්ධනය	කාර්යාලය සඳහා යන්ත්‍ර සූත්‍ර, උපකරණ හා වාහන මිලදී ගැනීම හා නඩත්තුව	ඉටුකරන ලද ප්‍රසම්පාදන කාර්යන් සංඛ්‍යාව මිලදී ගත් හා නඩත්තු කරන ලද යන්ත්‍ර සූත්‍ර, උපකරණ හා වාහන සංඛ්‍යාව හා එහි වටිනාකම	✓		
	කාර්යාලයීය පහසුකම් නඩත්තු කිරීම	නඩත්තු කරන ලද කාර්යාලයීය පරිසරය සහ අත්සන් කරන ලද සේවා ගිවිසුම් සංඛ්‍යාව	✓		
	කාර්යාලය සඳහා කාර්යාලයීය උපකරණ සහ ගෘහ භාණ්ඩ මිලදී ගැනීම	ඉටුකරන ලද ප්‍රසම්පාදන කාර්යන් සංඛ්‍යාව මිලදී ගන්නා ලද කාර්යාලයීය උපකරණ සහ ගෘහ භාණ්ඩ සංඛ්‍යාව	✓		
	කාර්යාලය සඳහා යන්ත්‍ර සූත්‍ර, උපකරණ හා වාහන මිලදී ගැනීම හා නඩත්තුව	ඉටුකරන ලද ප්‍රසම්පාදන කාර්යන් සංඛ්‍යාව මිලදී ගත් හා නඩත්තු කරන ලද යන්ත්‍ර සූත්‍ර, උපකරණ හා වාහන සංඛ්‍යාව හා එහි වටිනාකම	✓		

5.0 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ කාර්යසාධන දර්ශක

#	තිරසර සංවර්ධන අරමුණ	ඉලක්ක	දර්ශක	ඉටුකළ ක්‍රියාකාරකම් සංඛ්‍යාව	ක්‍රියාකාරකම්	සත්‍ය නිමැවුම		
						0 -49%	50-74%	75 - 100%
1	සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම **(2)**	2.1 2.4	- 2.4.1	13	ජනතාවගේ ජීවන වියදම අවම කිරීම සඳහා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම හා වසර පුරා ආහාර ලබා ගැනීම සඳහා ආහාර සුරක්ෂිත කිරීම උදෙසා ආහාර නිෂ්පාදකයන්ට, ආනයනකරුවන්ට හා අලෙවිකරුවන්ට අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම.			√
		2.3	2.3.2	02	කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයන්ගේ (කිරි ආශ්‍රිත නිෂ්පාදකයන්ගේ හා ධීවර ක්ෂේත්‍රයේ) වෙළඳපොල ගැටළු නිරාකරණය කරගැනීමට අවශ්‍ය මහ පෙන්වීම ලබා දීම.			√
2	නිරෝගී ජීවිත සහතික කර, සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම. **(3)**	3.8	3.8.1	01	සාමාන්‍ය ජනතාවට අත්‍යාවශ්‍ය සෞඛ්‍ය සේවා පහසුකම් ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනයට (ගුණාත්මකව ඉහළ හා අඩු වියදම් සහිත) මැදිහත් වීම.			√

#	තිරසර සංවර්ධන අරමුණ	ඉලක්ක	දර්ශක	ඉටුකළ ක්‍රියාකාරකම් සංඛ්‍යාව	ක්‍රියාකාරකම්	සත්‍ය නිමැවුම		
						0 -49%	50-74%	75 - 100%
3	පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම. **(4)**	4.3	-	01	සියලු දෙනාට ගුණාත්මක තෘතියික අධ්‍යාපනයක් ලබා දීමට අවශ්‍ය පහසුකම් සලසා දීම උදෙසා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට මැදිහත් වීම.			√
4	සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම **(6)**	6.1 6.3 6.4	6.3.2	01	ගුණාත්මකභාවයෙන් යුක්ත ජලය සහිත ජලාශ ප්‍රමාණය ඉහළ නැංවීම හා ජල පෝෂක කළමනාකරණය පිළිබඳව අවශ්‍ය මඟ පෙන්වීම ලබා දීම.			√
5	සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම **(7)**	7.1	-	04	බල ශක්ති අර්බුදය හමුවේ විකල්ප බල ශක්ති භාවිතා කිරීම හා එම ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය මැදිහත්වීම හා උපදෙස් ලබාදීම.			√
		7.ආ	-	11	බලශක්ති ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති හා උපාය මාර්ග නිර්දේශ කිරීම සඳහා උපදෙස් හා මඟ පෙන්වීම ලබා දීම.			√

#	තිරසර සංවර්ධන අරමුණ	ඉලක්ක	දර්ශක	ඉටුකළ ක්‍රියාකාරකම් සංඛ්‍යාව	ක්‍රියාකාරකම්	සත්‍ය නිමැවුම		
						0 -49%	50-74%	75 - 100%
6	සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම. **(8)**	8.1	-	06	වර්තමාන ආර්ථික තත්ත්වය ප්‍රතිසංස්කරණය උදෙසා ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් කිරීමට සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබා දීම.			√
		8.5	8.5.2	02	විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජාව සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා ජාතික වැඩසටහන් දියත් කිරීමට උපදෙස් ලබා දීම.			√
		8.9	-	02	සංචාරක කර්මාන්තය ආශ්‍රිත රැකියා ප්‍රවර්ධනය සඳහා එම කර්මාන්තයේ පවතින ගැටළු විසඳීමට මග පෙන්වීම ලබාදීම.			√
		8.10	-	02	සියලුදෙනාට බැංකු හා රක්ෂණ පහසුකම් සඳහා ප්‍රවේශ වීම සඳහා අවශ්‍ය කටයුතු දියත් කිරීමට මග පෙන්වීම ලබාදීම.			√
		8.අ	-	01	නිදහස් වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීම ලබාදීම.			√
		8.ආ	-	01	තරුණ ප්‍රජාව විදේශ රැකියා සඳහා යොමු කිරීම උදෙසා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම පිළිබඳ මග පෙන්වීම ලබා දීම.			√

#	තිරසර සංවර්ධන අරමුණ	ඉලක්ක	දර්ශක	ඉටුකළ ක්‍රියාකාරකම් සංඛ්‍යාව	ක්‍රියාකාරකම්	සත්‍ය නිමැවුම		
						0 -49%	50-74%	75 - 100%
7	සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිමත් කිරීම **(9)**	9.1	-	01	සියලු දෙනාට තිරසර, ගුණාත්මක හා සවිමත් යටිතල පහසුකම් ලබාදීම අරමුණු කොට ප්‍රාදේශීය, නාගරික මාර්ග හා අධිවේගී මාර්ග සංවර්ධනය ඇතුළු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම ලබාදීම.			√
		9.3	9.3.2	02	දේශීය කුඩා හා මධ්‍ය පරිමාන කර්මාන්තකරුවන් නගා සිටුවීම උදෙසා කළ හැකි ක්‍රියාකාරකම් පිළිබඳ උපදෙස් ලබා දීම.			√
08	නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම **(11)**	11.3	-	04	විධිමත් නගර සැලසුම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව උපදෙස් ලබා දීම හා සංස්කෘතික උරුමයන් රැකගැනීම සඳහා මඟ පෙන්වීම.			√
		11.4 11.1 11.3	11.1.1 11.3.2	15	අවිධිමත් ජනාවාස හා ප්‍රමාණවත් නොවන නිවාස පහසුකම් යටතේ ජීවත් වන නාගරික ජනගහනය සඳහා තිරසර මානව ජනාවාස සැලසුම් කිරීමට උපදෙස් ලබාදීම.			√
09	තිරසර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය සහ පිරිමැසුම්දායී භාවිතය. **(14)**	14.6	14.6.1	01	නීති විරෝධී හා පාළනය නොකල ධීවර කටයුතු මඟින් සමුද්‍රීය හා වෙරළබඩ පරිසර පද්ධති කෙරෙහි සිදු වන බලපෑම් වැලැක්වීම සඳහා අවශ්‍ය මැදිහත්වීම් සිදු කිරීම.			√

#	තිරසර සංවර්ධන අරමුණ	ඉලක්ක	දර්ශක	ඉටුකළ ක්‍රියාකාරකම් සංඛ්‍යාව	ක්‍රියාකාරකම්	සත්‍ය නිමැවුම		
						0 - 49%	50 - 74%	75 - 100%
10	භූගෝලීය පරිසර පද්ධතින්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියාකිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවත්වීම. **(15)**	15.1	15.1.2	01	ගොඩබිම අභ්‍යන්තරයේ පවත්නා මිරිදිය පරිසර පද්ධති තුල මත්ස්‍ය වගාව ඉහල නැංවීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම.			√
11	ක්‍රියාවට නැංවීමේ ක්‍රම සවිමත් කිරීම සහ තිරසාර සංවර්ධනය සඳහා වන ගෝලීය සහයෝගිතවයේ පුනර්ජීවනය. **(17)**	17.5 17.11 17.4	17.5.1 17.11.1 -	02	ඇඟලුම් කර්මාන්ත හා වෙළඳ ක්ෂේත්‍රයට වැඩිදියුණු කිරීම හා සංවර්ධනය වෙමින් පවත්නා රටවල අපනයනය සැලකිය යුතු මට්ටමකින් වර්ධනය කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම.			√
				04	ඉන්දියානු ණය සහනාධාර ක්‍රමය යටතේ අත්‍යාවශ්‍ය භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම.			√
12	සියලුම තිරසර සංවර්ධන අරමුණු	-	-	02	තිරසර සංවර්ධන අරමුණු සඳහා වන මෙහෙයුම් කමිටු සංවිධානය, අදාළ සම්බන්ධීකරණය හා ප්‍රගති සමාලෝචනය සිදු කිරීම.			√

5.2. තිරසර සංවර්ධන අරමුණ ළඟා කර ගැනීම සඳහා ඉලක්ක හා දර්ශක විස්තරාත්මකව හඳුනාගැනීම

ඉලක්කය	දර්ශකය	හැඳින්වීම
2.1		2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන්ද ඇතුලත්ව දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවධානමට ලක් වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී, පෝෂණයෙන් යුත්, ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම
2.3		2030 වන විට කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ, විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ස්වදේශික ජනයාගේ, ගොවි පවුල් සහ ධීවරයින්ගේ කෘෂිකාර්මික ඵලදායිතාව සහ ආදායම, ඉඩම්වලට ආරක්ෂාකාරීව සහ සමාන ලෙස ප්‍රවේශ වීමේ අවස්ථාවන්, අනෙකුත් නිෂ්පාදන සම්පත් හා ප්‍රදානයන්, දැනුම, මූල්‍ය සේවා, වෙළඳපොල සහ වටිනාකම් එකතු කිරීම් හා ගොවිපළ නොවන රැකියා සඳහා අවස්ථාවන් ලබා දීම මඟින් දෙගුණ කිරීම
	2.3.2	ස්ත්‍රී පුරුෂභාවය සහ ස්වදේශික මට්ටම අනුව සුළු පරිමාන ආහාර නිෂ්පාදකයින්ගේ සාමාන්‍ය ආදායම
2.4		2030 වනවිට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නා වූ , කාලගුණ වෙනස්වීම්වලට හැඩගැසීම සඳහා වූ ධාරිතාවයන් ශක්තිමත් කරන්න වූ හානිකර කාලගුණ තත්ත්වයන්, නියඟ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්ත්වයන් වර්ධනය කරන්න වූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම
	2.4.1	ඵලදායි සහ තිරසර කෘෂිකර්මය සිදුකරන කෘෂිකාර්මික භූමි ප්‍රමාණය
3.8		මූල්‍ය අවධානයට පත්වීම සඳහා ආරක්ෂණය ද ඇතුළත්ව ආරක්ෂාකාරී, ඵලදායී, ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු වියදමකින් ලබාගත හැකි ඖෂධ, එන්නත් හා අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවන් සියලුදෙනාටම ලබාගත හැකි වීම ඇතුළුව විශ්වීය මට්ටමින් සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට හැකි වීම

ඉලක්කය	දර්ශකය	හැඳින්වීම
	3.8.1	අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවා ආවරණය (සාමාන්‍ය ජනතාව සහ වඩාත් පහසුකම් අඩු ජනගහණයන් අතර ප්‍රජනන, මාතෘ, ළදරු, ළමා, සෞඛ්‍ය, බෝවන රෝග, බෝ නොවන රෝග සහ සේවා පහසුකම් සඳහා වන සුලභතාවය ලෙස අර්ථ දැක්වේ.)
4.3		2030 වන විට සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබාගත හැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතියික අධ්‍යාපනය ලබා ගැනීමට හැකිවීම
6.1		2030 වන විට සියලුදෙනාට සමානාත්මතාවයෙන් යුතුව ආරක්ෂාකාරී සහ අඩු මිලකට පානීය ජලය ලබා ගැනීමට හැකි වීම
6.3		2030 වන විට ජල දූෂණය අඩු කරමින් ජලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම, හානිකර විෂ රසායනික සහ වෙනත් ද්‍රව්‍ය බැහැර කිරීම සහ මුදා හැරීම තුරන් කිරීම, පිරිපහදු නොකරන ලද අප ජලය මුදා හැරීම අඩු කිරීම සහ ජලය සැලකිය යුතු මට්ටමින් ප්‍රතිචක්‍රීයකරණය සහ ආරක්ෂාකාරීව නැවත භාවිතා කිරීම
	6.3.2	ගුණාත්මක භාවයෙන් යුක්ත ජලය සහිත ජලාශ ප්‍රමාණය
6.4		2030 වන විට සියලුම ක්ෂේත්‍රයන්හි කාර්යක්ෂමව ජලය භාවිතා කිරීම සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම, තිරසර අන්දමින් ජලය ලබා ගැනීම සහ සැපයීම, ජලය හිහකම මඟ හැරවීම සඳහා සහ ජලය හිඟ කමින් පීඩා විඳින ජනතාවගේ සංඛ්‍යාව ප්‍රාමාණික ලෙස අවම කිරීම
7.1		2030 වන විට සියලුදෙනාටම අඩු මිලකට ලබාගත හැකි විශ්වාසදායී නවීන බලශක්ති මූලාශ්‍රවලට ප්‍රවේශව විය හැකි බව තහවුරු කිරීම
7.ආ		2030 වන විට විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වූ රටවල, කුඩා දිවයින් රාජ්‍යයන්හි සහ අනෙකුත් රටවල දේශ සීමාවන්ගෙන් ආවරණය වූ සංවර්ධනය වෙමින් පවත්නා රටවල්ද ඇතුලත්ව සියළුම සංවර්ධනය වන රටවලට ඔවුන්ගේ වැඩසටහන් සැලසුම්වලට අනුකූලව නවීන සහ තිරසර බලශක්ති සේවා සැපයීම සඳහා යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම සහ තාක්ෂණය වැඩිදියුණු කිරීම

ඉලක්කය	දර්ශකය	හැඳින්වීම
8.1		ජාතික තත්ත්වයන්ට අනුකූලව ඒක පුද්ගල ආර්ථික වර්ධනය පවත්වාගෙන යාම සහ විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල් වසරකට අවම වශයෙන් වසරකට 7%ක දල ජාතික නිෂ්පාදිතයේ වර්ධනයක් පවත්වාගෙන යාම
8.5		2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින්ද ඇතුලත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථාවන් ලබා දීම
	8.5.2	ස්ත්‍රී/පුරුෂභාවය, වයස සහ ආබාධිත සහිත පුද්ගලයන්ට අදාලව විරැකියා අනුපාතය
8.9		2030 වන විට දේශීය සංස්කෘතිය, නිෂ්පාදනය හා රැකියා අවස්ථාවන් ප්‍රවර්ධනය කරන්නා වූ තිරසර සංචාරක කර්මාන්ත පිලිබඳ ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
8.10 8.අ		සියලු දෙනාටම බැංකු පහසුකම් රක්ෂණ, සහ මුල්‍ය සේවාවන් ලබා ගැනීමට ප්‍රවේශ විය හැකි පරිදි දේශීය මුල්‍ය ආයතන වල ධාරිතාවන් ශක්තිමත් කිරීම විශේෂයෙන් අවම වශයෙන් සංවර්ධනය වූ රටවල්ද ඇතුලත්ව සංවර්ධනය වෙමින් පවත්නා රටවලට වෙළඳාම සම්බන්ධයෙන් ලබා දෙන ආධාර වැඩි කිරීම. අවම වශයෙන් සංවර්ධනය වූ රටවලට වෙළඳාම සම්බන්ධ තාක්ෂණික සහය ලබා දීම සඳහා වූ ඒකාබද්ධ වැඩ සැලැස්මට අනුකූලව කටයුතු කිරීම
8.ආ		තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ලබා දීම සඳහා ජගත් මට්ටමින් ක්‍රමෝපායක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාවට නැංවීම හා අන්තර්ජාතික කම්කරු සංවිධානයේ
9.1		ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශය විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදුකරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

ඉලක්කය	දර්ශකය	හැඳින්වීම
9.3		විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල කුඩා පරිමාණ කර්මාන්ත සහ වෙනත් ව්‍යවසායන් සඳහා මූල්‍ය සේවාවන්, ණය ලබා ගැනීමේ ප්‍රවේශය සහ අවස්ථාවන් ඉහළ නැංවීම සහ එම ව්‍යවසායන් වටිනාකම් දාමයන්ට සහ වෙළඳපොල දාමයන්ට ඒකාබද්ධ කිරීම
	9.3.2	ණය හෝ ණය බැඳීම සහිත කුඩා පරිමාණ කර්මාන්ත ප්‍රමාණය
11.1		2030 වනවිට සියලුම දෙනාට ප්‍රමාණවත් ආරක්ෂාකාරී සහ අඩු මිලට ලබාගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩිදියුණු කිරීම
	11.1.1	පැල්පත්, අවිධිමත් ජනාවාස හෝ ප්‍රමාණවත් නොවන නිවාස පහසුකම් යටතේ ජීවත්වන නාගරික ජනගහනයේ ප්‍රමාණය
11.3		2030 වන විට සියලුදෙනා අන්තර්කරණය වූ සහ තිරසර නාගරීකරණය වැඩිදියුණු කිරීම සහ සියලුම රටවල සහභාගීත්ව, ඒකාබද්ධ සහ තිරසර මානව ජනාවාස සැලසුම් කිරීම
	11.3.2	විධිමත් සහ ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ක්‍රියාවට නැංවෙන නගර සැලසුම් සහ කළමණාකරන ක්‍රියාවලියක් තුළ සිවිල් සමාජය සඳහා සෘජුව සහභාගී විය හැකි ව්‍යුහයක් සහිත නගර ප්‍රමාණය
11.4	14.6.1	ලෝකයේ ස්වභාවික සහ සංස්කෘතික උරුමයන් රැකගැනීම හා ආරක්ෂා කරගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම රටවල් අනුව නීති විරෝධී, වාර්තා නොවූ සහ නියාමනය නොකළ මසුන් ඇල්ලීම මැඩලීම ඉලක්ක කරගත් ජාත්‍යන්තර ක්‍රමෝපායන් ක්‍රියාවට නැංවීමේ මට්ටම පිළිබඳ ප්‍රගතිය

ඉලක්කය	දර්ශකය	හැඳින්වීම
15.1		භූමියේ සහ ගොඩබිම අභ්‍යන්තරයේ පවත්නා මිරිදිය පරිසර පද්ධති සහ ඒවායින් ලැබෙන්නා වූ සේවාවන්, විශේෂ වනාන්තර, කඳු සහ වියලි බිම් අන්තර්ජාතික ගිවිසුම් වලට අනුකූල වන පරිදි සංරක්ෂණය, නැවත නගා සිටුවීම සහ තිරසර අන්දමින් භාවිතා කිරීම තහවුරු කිරීම
	15.1.2	ආරක්ෂිත ප්‍රදේශ හා පරිසර පද්ධති ආකාර අනුව භෞතික හා මිරිදිය ජෛව විවිධත්වය සඳහා වන වැදගත් ස්ථාන ප්‍රමාණය
17.5		අවම වශයෙන් සංවර්ධනය වන රටවල ආයෝජන ප්‍රවර්ධන කලාප යොදා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම
	17.5.1	ඌන සංවර්ධිත රටවල් සඳහා ආයෝජන ප්‍රවර්ධන යොදාගෙන ඇති සහ ක්‍රියාත්මක කරන රටවල් සංඛ්‍යාව
17.11		අවම වශයෙන් සංවර්ධනය වූ රටවලින් ලෝක අපනයනයට සපයන කොටස දෙගුණ කිරීමේ දැක්මකින් යුක්තව, සංවර්ධනය වෙමින් පවත්නා රටවල අපනයන සැලකිය යුතු මට්ටමකින් වර්ධනය කිරීම
	17.11.1	ලෝක අපනයනයන්හි සංවර්ධනය වෙමින් පවත්නා සහ ඌන සංවර්ධිත රටවල පංගුව
17.4		මූල්‍ය ණය, ණය සහනාධාර සහ ණය ප්‍රතිව්‍යුහගතකරණය ඉලක්ක කරගත් සම්බන්ධීකරණය කරන ලද ප්‍රතිපත්ති මඟින් සංවර්ධනය වෙමින් පවත්නා රටවල්වලට දිගුකාලීන ණය ස්ථාවරභාවය සඳහා සහය ලබා දීම සහ අතිශයින් ණයගැතිභාවයට පත්වී ඇති දරිද්‍රතාවයෙන් පෙළෙන රටවලට ණය ආතතිකාරී තත්ත්වයෙන් මිදීම සඳහා විසඳුම් ලබා දීම

6.0 මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	62	32	30
තෘතීයික	26	16	10
ද්විතීයික	249	121	128
ප්‍රාථමික	224	106	118

(2022.12.31 දින දක්වා)

6.2 සේවක අතිරික්තය හෝ සේවක හිඟය ආයතනයේ කාර්ය සාධනයට බලපාන ආකාරය

2022.12.31 දිනට ආයතනයේ ජ්‍යෙෂ්ඨ, තෘතීයික, ද්විතීයික සහ ප්‍රාථමික යන සියලු මට්ටම්වල සේවා ඝනයන්හි සේවක හිඟයක් පවතින ලදී.

2022 වර්ෂය තුළ මුදල් අමාත්‍යාංශය විසින් රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් සියලු රජයේ ආයතන වෙත ලබා දෙන ලද උපදෙස් අනුව, සේවක සංඛ්‍යා කළමනාකරණය සම්බන්ධයෙන් දැඩිව අවධානය යොමු කර තිබූ අතර, ඒ අනුව නව බඳවා ගැනීම්/ පත් කිරීම් සිදු කිරීමකින් තොරව පවතින කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම කෙරෙහි අවධානය යොමු කිරීමේ වැදගත්කම ද පෙන්වා දී තිබුණි.

එමෙන්ම, ගරු අග්‍රාමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ මෙන්ම අග්‍රාමාත්‍ය කාර්යලය සඳහා අනුමත තාවකාලික කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා පත් කිරීමද තනතුරු කිහිපයකට පමණක් සීමා කරන ලදී.

අනුමත සේවක සංඛ්‍යාවට අනුව පුරප්පාඩු පැවතියද ආයතනයේ රාජකාරී සඳහා බාධාවක් නොවන සේ රාජකාරී ඉටු කිරීමේ හැකියාව මැන බැලීම සඳහා වැඩ අධ්‍යයනයක් සිදු කරන ලද අතර, ඒ අනුව, ආයතනික සංවිධාන ව්‍යුහය සංශෝධනය කරන ලදී. තවද, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා දත්ත කළමනාකරණ පද්ධති භාවිතා කරමින් රාජකාරී කටයුතු කිරීමට නැඹුරු වීම මඟින් දෛනික කටයුතු කාර්යක්ෂම හා ඵලදායී ලෙස මානව සම්පත මනා කළමනාකරණය තුළින් විශිෂ්ට කාර්ය සාධනයක් පවත්වා ගන්නා ලදී.

6.3. මානව සම්පත් සංවර්ධනය

අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිලධරයන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීම තුළින් කාර්යාල කටයුතු කාර්යක්ෂමව හා ඵලදායිව ඉටු කිරීමට අවකාශ සැලසීමත්, සේවයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමත් අරමුණු කරගනිමින් දේශීය සහ විදේශීය පුහුණු වැඩසටහන් සඳහා නිලධරයන් යොමු කිරීමට කටයුතු කර ඇත.

ඒ අනුව, 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා කාල වකවානුව තුළ යොමු කර ඇති දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා/ වැඩසටහන්/ වැඩමුළු පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

දේශීය සහ විදේශීය පුහුණු වැඩසටහන්

#	පුහුණු වැඩසටහන	ඉලක්ක ගත නිලධාරීන්	දේශීය/ විදේශීය	කාල සීමාව	සහභාගී වූ ගණන
01.	පුද්ගල සංවර්ධන පුහුණු වැඩමුළුව	සියලුම සේවා මට්ටම්වල නිලධාරීන්	දේශීය	2022.03.21 - 22	17
02.	Diploma in English for Junior Executives	ද්විතීයික මට්ටමේ නිලධාරීන්	දේශීය	2022	01
03.	Diploma in English for Junior Executives	ද්විතීයික මට්ටමේ නිලධාරීන්	දේශීය	2022	01
04.	Web Development Program	ද්විතීයික මට්ටමේ නිලධාරීන්	දේශීය	2022	01

#	පුහුණු වැඩසටහන	ඉලක්ක ගත නිලධාරීන්	දේශීය/ විදේශීය	කාල සීමාව	සහභාගී වූ ගණන
05.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 අනුව දෙමළ භාෂා පාඨමාලා පැවැත්වීම	ද්විතීයික මට්ටමේ නිලධාරීන්	දේශීය	පැය 150	43
06.	අග්‍රාමාත්‍ය කාර්යාලයේ මූලික ඵලදායිතා සංකල්ප පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව - 2022 - දෙවන කණ්ඩායම	සියලුම සේවා මට්ටම්වල නිලධාරීන්	දේශීය	2022.09.15 – 2022.10.20 (දින 06)	73
07.	අග්‍රාමාත්‍ය කාර්යාලයේ මූලික ඵලදායිතා සංකල්ප පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව - 2022 - තෙවන කණ්ඩායම	සියලුම සේවා මට්ටම්වල නිලධාරීන්	දේශීය	2022.09.15 – 2022.10.20 (දින 06)	76
08.	Training on Managing Evaluations for Public Officials	මාණ්ඩලික නිලධාරීන්	දේශීය	2022.09.26 – 2022.09.30	01
09.	රථ වාහන රක්ෂණය සහ රක්ෂණ ප්‍රතිලාභ ලබාගැනීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩමුළුව	සියලුම සේවා මට්ටම්වල නිලධාරීන්	දේශීය	2022.10.05, 06, 07 (කණ්ඩායම් 03ක්)	95
10.	Certificate Course in English Language	ද්විතීයික මට්ටමේ නිලධාරීන්	දේශීය	2022.10.14 දින සිට (පැය 72)	02
11.	තිරසර සංවර්ධන අභිමතාර්ථ ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධ්‍යයනය - පකිස්ථානය	මාණ්ඩලික නිලධාරීන්	විදේශීය	2022.02.21 – 2022.02.28	01
12.	Executive Training Program for Sri Lankan Special Grade Officers - Pakistan	මාණ්ඩලික නිලධාරීන්	විදේශීය	2022.03.21 - 2022.04.03	01
13.	Australia Awards Scholarship - 2022	මාණ්ඩලික නිලධාරීන්	විදේශීය	2022 - 2023	01
14.	Short Course of Promoting Value Chain Improvements, Market Integration and Trade in Agribusiness – Australia	මාණ්ඩලික නිලධාරීන්	විදේශීය	2022.06.13 – 2022.11.02	01

#	පුහුණු වැඩසටහන	ඉලක්ක ගත නිලධාරීන්	දේශීය/ විදේශීය	කාල සීමාව	සහභාගී වූ ගණන
15.	Seminar on Internet of Things (IOT) technology for countries under belt and road initiative (Online)	මාණ්ඩලික නිලධාරීන්	විදේශීය	2022.07.15 – 2022.08.04	01
16.	Seminar on Party & Government for Senior Officials from Sri Lanka (Online)	මාණ්ඩලික නිලධාරීන්	විදේශීය	2022.11.09 – 2022.11.22	01
17.	AIBO - Seminar on China's Poverty Alleviation Practices for Developing Countries (Online)	මාණ්ඩලික නිලධාරීන්	විදේශීය	2022.11.10 – 2022.11.23	01
18.	Foresight for Public - Sector Organizations (Online)	මාණ්ඩලික නිලධාරීන්	විදේශීය	2022.12.13 – 2022.12.16	01

07. අනුකූලතා වාර්තාව

7.1. අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනය ඉදිරිපත් කර තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව , සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණය විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කිරීම	අදාළ නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කිරීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කිරීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අදාළ නොවේ		
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කිරීම	අදාළ නොවේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර , වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිලිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස්කොට තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

08. විගණකාධිපති නිරීක්ෂණ

8.1 විගණකාධිපති නිරීක්ෂණ

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. TPD/C/PMO/22/FA/01 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 මැයි 30 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
අග්‍රාමාත්‍ය කාර්යාලය

ශීර්ෂය - 002 අග්‍රාමාත්‍ය කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය - 002 අග්‍රාමාත්‍ය කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අග්‍රාමාත්‍ය කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අග්‍රාමාත්‍ය කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට මා ප්‍රකාශ කරමි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(අ) 2022 වර්ෂය සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයේ වැය විෂයයන් 10ක් සඳහා වෙන් කරන ලද මුළු ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් 26% සිට 68% දක්වා පරාසයක එකතුව රු.98,362,648 ක ප්‍රතිපාදන ඉතිරිවීමක් තිබුණි.

(ඇ) නියැදි විගණන පරීක්ෂාව අනුව 2022 වර්ෂයේ අවස්ථා 3 කදී දරන ලද එකතුව රු.362,720 ක මූලධන වියදම් පුනරාවර්ථන වියදමක් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2022 වර්ෂය තුල අවස්ථා 17 කදී දරන ලද රු.70,948,731 ක පුනරාවර්ථන වියදම් නිවැරදි වැය විෂයන් තුළ ඇතුළත් නොකර 002-1-1-0-1409 (වෙනත්) වැය විෂය යටතේ සටහන් කර තිබූ බව නියැදි පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

(ඉ) විදුලි හා ජල බිල්පත් සඳහා දරන ලද වියදම් රු.8,278,004 ක් 002-1-1-0-1403 (ජල විදුලි බිල්පත්) වැය විෂයයට ඇතුළත් නොකර වෙනත් වැය විෂයයන් 2 ක් යටතේ ගිණුම්ගත කර තිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.3 ඡේදයේ සඳහන් පරිදි වාර්තාකරණ ආයතනයේ ඇති බැඳීම් හා බැරකම් 2022 දෙසැම්බර් 31 දිනට බැඳීම් අංක අනුව හෙළිදරව් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ එකතුව 1,390,406 ක්වූ බැඳීම් හා බැරකම් මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම් අංක iii යටතේ ඇති බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි හෙළිදරව් කර නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ)	මූදල් රෙගුලාසි 110 (1) (ii)	2022 වර්ෂය තුල සිදු වූ සියලුම අලාභහානි පිළිබඳ විස්තර හානිපාඩු ලේඛනයේ ඇතුලත් කර නොතිබුණි .

(ආ)	මුදල් රෙගුලාසි 396(ඇ)	රු.216,605 ක් වටිනා වෙක්පත විගණිත දිනය වූ 2023 මාර්තු 29 දින වන විට නිකුත් කර මාස 06ක් ඉක්මවා ඇතත් ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඇ)	මුදල් රෙගුලාසි 880 හා 891(i)	රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුව ඇප තැබිය යුතු සියළුම නිලධාරීන් විසින් ඇප තබන බවට වග බලාගනු සඳහා කටයුතු කළ යුතු විය. ඇප තැබීමට අවශ්‍ය සියළුම නිලධාරීන්ගේ නම් ඇතුලත් ඇප ලේඛනයක්, එක් එක් දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යාලයේ වඩාත් මැනවින් වූ අකාරාදි ක්‍රමයට පිළියෙල කොට පවත්වාගෙන යා යුතු වුවත් එම ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන නොතිබුණි.
(ඈ)	2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ හි 8.3 ඡේදය හා අංක 2020/02 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ ඡේද අංක 10.1	සියළුම වාර්තාකරණ ආයතන විසින් තැන්පතු සඳහා සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතු අතර, එම සැසඳීම් ප්‍රකාශයේ පිටපතක් 2023 පෙබරවාරි 28 වන දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.4 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2022 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම වාර්ෂික සැසඳුම් ප්‍රකාශයේ අවසාන කේවල ශේෂය රු.50,086,632 ක් වූ අතර සාමාජික ණය ලේඛනයේ අවසාන ශේෂය රු.49,509,284 ක් වූයෙන් රු.577,348 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

(ආ) 2022 සැප්තැම්බර් මාසයේදී සේවය අතහැර ගොස් ඇති නිලධාරියෙකුගේ රු.191,602 ක ආපදා ණය මුදලක් විගණිත දිනය වන විට අයවිය යුතුව තිබුණි.

(ඇ) විශ්‍රාම ගිය නිලධාරීන් 5 දෙනෙකුගෙන් එකතුව රු.1,034,577 ක ණය මුදලක් 2022 දෙසැම්බර් 31 දිනට අයවීමට තිබුණු බව නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

2022 වර්ෂයට අදාලව අග්‍රාමාත්‍යවරයාගේ උපදේශන හා මාර්ගෝපදේශ යටතේ විවිධ ක්ෂේත්‍රයන්ට අදාලව පවත්වන ලද රැස්වීම් හා සාකච්ඡා 95ක් වන අතර එයින් එළැඹී තීරණ / පසුවිපරම් කළ කරුණු 355ක් විය. තවද සිදුකළ ශක්‍යතා අධ්‍යන සංඛ්‍යාව 19ක් ලෙස කාර්යසාධන වාර්තාවෙන් තොරතුරු ඉදිරිපත්කර තිබුණි. උක්ත කාර්යසාධන වාර්තා වලට අදාල පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ඒකාබද්ධ වාණිජ මණ්ඩල, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශ හා ඇහළුම් කර්මාන්ත නියෝජිතයන් සමග රටේ පවතින ආර්ථික තත්ත්වය හා ගැටළු පිළිබඳ 2022 වර්ෂයේදී පවත්වන ලද රැස්වීම් 03 කට අදාල සාකච්ඡා කළ කරුණු සම්බන්ධයෙන් 2022 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව නිරීක්ෂණය නොවීය.

(ආ) 2022 ජනවාරි 01 සිට 2022 ජුනි 30 දක්වා පවත් වන ලද රැස්වීම්, සාකච්ඡා හා උත්සව 11 කට අදාලව රැස්වීම් සටහන් අග්‍රාමාත්‍ය කාර්යාලයේ සංවර්ධන අංශ 1 වෙත යොමු කළ ද ඊට අදාල ක්‍රියාමාර්ග සහ පසුවිපරම් කිරීම අදාල අංශය විසින් සිදුකර තිබුණු බව නිරීක්ෂණය නොවීය.

3.2 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෙනත් ආයතන සතු වාහන 17 ක් නිසි පරිදි පවරා ගැනීමකින් තොරව අග්‍රාමාත්‍ය කාර්යාලය භාවිතා කරනු ලැබේ. එම වාහන අතරින් මාර්ග සංවර්ධන අධිකාරියෙන් අග්‍රාමාත්‍ය කාර්යාලයේ භාවිතයට ගෙන ඇති වාහනයක් 2022 ජනවාරි 14 වන දින අනතුරකට ලක්වී ඒ සඳහා වූ රු.46,600 ක අලාභහානිය සඳහා අදාල රක්ෂණ වන්දිය ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයෙන් ලබාගත් බවට විගණනයට තහවුරු නොවීය.

(ආ) අග්‍රාමාත්‍ය කාර්යාලය සතු වාහන 6 ක් අනෙකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල වෙත තාවකාලිකව ලබා දී තිබුණත් මෙම වාහන නැවත අග්‍රාමාත්‍ය

කාර්යාලයට පවරා දිය යුතු නිශ්චිත දිනයක් එහි සඳහන් වී නොතිබුණ අතර 2023 අප්‍රේල් 30 විගණිත දිනය වන විටත් මෙම වාහන පවරා දුන් කාර්යාලය විසින් භාවිතා කරමින් පැවතුණි.

(ඇ) අග්‍රාමාත්‍යවරයාගේ ආරක්ෂිත රථ පෙළට ඇතුළත් බෙන්ස් කාර් 3 ක් 2023 අප්‍රේල් දක්වා ලියාපදිංචි කර නොතිබුණ අතර ඒවායින් එක රථයක් රක්ෂණය කර නොතිබුණි.

(ඈ) වෙනත් ආයතන වලට වාහන මුදා හැරීම සම්බන්ධයෙන් විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව ජනාධිපති කාර්යාලයෙන් වාහන 03 ක් අග්‍රාමාත්‍ය කාර්යාලයට ලබා දී ඇති බව දන්වා තිබුණ ද අග්‍රාමාත්‍ය කාර්යාලයේ වාර්තා අනුව ජනාධිපති කාර්යාලයෙන් වාහන 04 ක් ලැබී තිබුණ බවත් වාහන අංක ද එකිනෙකට නොසැසඳෙන බවත් නිරීක්ෂණය විය.

(ඉ) විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව, අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් ජනාධිපති කාර්යාලයට වාහන 04 ක් මුදා හැර ඇති බව අග්‍රාමාත්‍ය කාර්යාලය වාර්තා කළ ද එවැනි වාහන 04 ක් අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් සපයා නොමැති බව ජනාධිපති කාර්යාලය වාර්තා කර තිබුණි.

3.3 පාඩු හා හානි

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2022 ජනවාරි 19 වන දින සිදුවූ වාහන අනතුරකට අදාල රු.1,583,245 ක හානිය වෙනුවෙන් රක්ෂණ සමාගමෙන් රු.1,557,045 ක මුදලක් ලබා දී තිබුණ අතර ඉතිරි රු.26,200 ක හානියක් හානි පාඩු ලේඛනයේ අනාවරණය කර නොතිබුණි. එම අලාභය පොත් වලින් ඉවත් කිරීමට හෝ වගකිව යුතු පාර්ශවයෙන් අය කර ගත් බවට විගණනයට තහවුරු නොවිය.

(ආ) වෙඩි නොවදින රථයකට 2022 ජූලි 09 දින රටේ ඇති වූ කළබලකාරී තත්ත්වය හේතුවෙන් සිදුව ඇති හානිය විගණිත දිනය වූ 2023 මාර්තු 29 දිනය දක්වා ගණන් බලා නොතිබුණි. රු.මිලියන 263 ක රක්ෂණ ආවරණයෙන් රු.මිලියන 200 ක මුදලක් පමණක් ආවරණය කර ගැනීමට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමාගමෙන් අනුමත කර තිබුණි. අලුත්වැඩියාවට අවශ්‍ය අමතර කොටස් රට තුළ නොමැති වීම නිසා මාස 09 කට ආසන්න කාලයක් එම රථය ගර්හිත තත්ත්වයේම පවතී.

(ඇ) නවත් රථයකට 2022 මැයි 10 දින රු.874,586 ක අලාභහානියක් සිදුව ඇති අතර එම අලාභහානිය සම්පූර්ණයෙන් රක්ෂණ ආයතනය විසින් ආවරණය කළ බවට ලිඛිත සාක්ෂි ගොනුවේ ඇතුළත් කර නොතිබුණි. මෙම රථය අළුත්වැඩියාවට අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීමට අදාල බිල්පත් පිළිගත නොහැකි බවට රක්ෂණ සමාගම දැනුම් දී තිබුණි. ඒ අනුව මෙම රථයට සිදුවූ මුළු අලාභය සහ රක්ෂණ සමාගමෙන් ආවරණය කර තිබූ හානියේ ප්‍රමාණය විගණනයේදී අනාවරණය කර ගත නොහැකි විය.

(ඈ) 2022 මැයි 24 දින හා 2022 මැයි 31 වන දින සිදුවූ රථ වාහන 2 කට අදාල අනතුරු, හානි පාඩු ලේඛනයේ දක්වා තිබුණත් දෙපාර්තමේන්තු ලිපිගොනු අංක PMO/ADM/02/03/2101 ගොනුවට අනුව මෙම අනතුරු පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදු කළ බවට විගණනයට තහවුරු කරගත නොහැකි විය.

(ඉ) 2022 දෙසැම්බර් 01 දින අනතුරකට ලක්වී රථයකට අදාල ව රු.129,100 ක හානියක් සිදුවී තිබුණි. එම මුදල රක්ෂණ සමාගමෙන් ආවරණය වී ඇති බවට අලාභහානි ලේඛනයේ සඳහන් වුවද විගණනයේදී තොරතුරු තහවුරු කර ගත නොහැකි විය.

(ඊ) අලාභහානි වටිනාකම් එකතුව රු.203,181,631 ක් වූ 2022 වර්ෂයේ සිදුවී ඇති වාහන අනතුරු 08 ක් සම්බන්ධයෙන් මු.රෙ.104(1) ප්‍රකාරව අලාභය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් 2023 අප්‍රේල් 17 විගණිත දිනය වන විටත් එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

3.4 2022 වර්ෂයේ රට තුළ පැවති කළබලකාරී තත්ත්වයන් මත සිදුවූ අලාභහානි

2022 වර්ෂයේ අවස්ථා ගණනක දී ඇතිවූ කළබලකාරී තත්වයන් මත අග්‍රාමාත්‍ය කාර්යාලයට හානි සිදුවී තිබුණු අතර ඊට අදාල විගණනයට ඉදිරිපත් වූ තොරතුරු වලට අදාල ව පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කළබල හේතුවෙන් අග්‍රාමාත්‍ය කාර්යාලයට සිදු වී ඇති මුළු හානිය රු.111,043,124 ක් බව 2023 අප්‍රේල් 21 දිනැති අංක PMO/FIN/01/13/01/01/2023 දරන ලිපිය මඟින් අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් විගණනයට වාර්තා කර තිබුණි. මෙම හානි සම්බන්ධයෙන් මු.රෙ. 103 - මු.රෙ.104 පරිදි කටයුතු කිරීම පිළිබඳ තොරතුරු 2023 අප්‍රේල් 28 විගණිත දිනය වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණ අතර මෙම හඳුනාගත් අලාභ හානි මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි.

(ආ) 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව භාණ්ඩාගාර 66 ආකෘතිය හා කළබල හේතුවෙන් අලාභහානි සිදුවූ බවට හඳුනාගත් බඩු ලැයිස්තුව අතර භාණ්ඩ වර්ග 13 ක වෙනස්කම් පැවතුණ අතර 2022 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව කළබල හේතුවෙන් හානි වූ භාණ්ඩ ලෙස හඳුනාගත් භාණ්ඩ වර්ග 27 ක් කළබල හේතුවෙන් හානි වූ භාණ්ඩ පිළිබඳ අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් සපයන ලද වාර්තාවේ ඇතුළත් වී නොතිබුණ බව නිරීක්ෂණය විය.

(ඇ) කළබලකාරී තත්ත්වය හේතුවෙන් භාණ්ඩ වර්ග 20 ක් අස්ථානගත වී ඇති බවට අග්‍රාමාත්‍ය කාර්යාලය ඉදිරිපත් කළ වාර්තාවේ සඳහන් වුවත් 2022 වර්ෂය සඳහා සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයේදී ඒ බව හඳුනාගෙන නොතිබුණි.

(ඈ) අග්‍රාමාත්‍ය කාර්යාලය ලබා දුන් වාර්තාව අනුව 2022 මැයි 09 වන දින අරලියගහ මන්දිරය හා මහජන සම්බන්ධතා අංශයේ සිදු වූ මුළු අලාභය ලෙස රු.8,342,688.60 ක් ලෙස දක්වා ඇතත් ඒ සමඟ ලබාදී ඇති ඇමුණුම් වල තොරතුරු අනුව එය රු.8,437,438.60 ක් විය. ඒ අනුව රු.94,750.00 ක වෙනසක් නිරීක්ෂණය විය.

4 කළමනාකරණ දුර්වලතා

(අ) 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛ ප්‍රකාරව රාජ්‍ය වියදම් ඉතා අත්‍යාවශ්‍ය සේවාවන්ට පමණක් යොදාගත යුතු බවත්, ගොඩනැගිලි ඉදිකිරීම් හා කුළියට ගැනීම් නැවැත්වීම් දැඩිව අනුගමනය කළ යුතු බවත්, සඳහන් කර නිබියදීත් අග්‍රාමාත්‍ය කාර්යාල නිල නිවසේ නඩත්තු හා අළුත්වැඩියා සඳහා 2022 වර්ෂයේ දී රු.මිලියන 182 ක් වැය කර තිබුණු අතර 2021 වර්ෂයේ දී ද රු.මිලියන 58 ක් වැය කර තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) 2022 අප්‍රේල් 26 වන දිනැති රාජ්‍ය අයවැය චක්‍රලේඛ අංක 03/2022 හා එහි xiv පරිච්ඡේදයට අනුව රජයේ වියදම් සීමා කර නිබියදීත් රු.569,344 ක වියදමක් දරමින් අග්‍රාමාත්‍යතුමාගේ පාර්ලිමේන්තු ප්‍රකාශ ඇතුළත් කෘතියේ පළමු වෙළුම මුද්‍රණය කර තිබුණි. එහි පිටපත් 197 ක් 2023 අප්‍රේල් 21 දක්වා බෙදාහැර නොතිබුණි.

5 මානව සම්පත් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 561 ක් වූ අතර ඉන් තනතුරු 286 ක් පුරප්පාඩුව පැවතුනි. එම පුරප්පාඩු වලින් 30 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විය.

බී.ඕ.ඩී. ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට